// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,092 — 1964 ජූලි 3 වැනි සිකුරාද—1964.7.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 911 | කොටුපල් ඩේන්ද හා වෙනත් ඩේන්ද විකිණීම ... ... | 963 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 927 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 932 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... ... | 961 | වෙන්දේසි කිරීම පිළිබඳ දන්වීම් ... ... | 963 |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | — | විවිධ දන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත්, ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේය. තම ආධුනික/ පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේය.

සංලක්ෂ්‍යය.—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කින් සමත්වීමටද ඔවුන්ට නියම වනු ඇත.

(5) අවශ්‍ය සුදුසුකම්.—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසු කම් ලෙස නියමකොට ඇති ශුම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු

සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වේ නොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවන්නේ ය).

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සැම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නා වූ ද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සැම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදාතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලක රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටින් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු, ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.—සුදුසුකම් ලැබීම සඳහා වැටුප යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප්, දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

## යුනෙස්කෝවේ තනතුරු

### සාමාජික රාජ්‍යයන් වෙත දන්වා තිබෙන මෙහි පහත සඳහන් වන පුරප්පාඩු සඳහා යුනෙස්කෝව විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ

**1. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංසන්දනාත්මක අධ්‍යාපනය පිළිබඳ අංශයේ ප්‍රධාන තනතුර—ඊඩී 200**

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) අධ්‍යාපනය පිළිබඳ පශ්චාත්-උපාධි වැඩකටයුතු හා සංසන්දනාත්මක අධ්‍යාපනය හෝ අධ්‍යාපනික මනෝවිද්‍යාව සම්බන්ධ පර්යේෂණ න්‍යාය පිළිබඳ හුරුපුරුදුකම.

(ආ) ඉගැන්වීම, අධ්‍යාපන පරිපාලනය හා ඒ ඒ රාජ්‍යයන්හි අධ්‍යාපන ප්‍රතිපදාවන් පිළිබඳ පෘථුල පළපුරුද්ද.

(ඉ) ඉංග්‍රීසි භාෂාව සහ/හෝ ප්‍රංශ භාෂාව පිළිබඳ ව්‍යක්ත දැනුමක් හා අනික් භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම.

වැටුප වර්ෂයකට අමෙරිකානු ඩොලර් 10,650.

**2. ජාතික විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන අංශයේ වැඩ සටහන් විශේෂඥ—එස් ඒෆ්-එන්එස්—26.**

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් හෝ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය විෂයයෙහි අවශ්‍ය ශික්ෂණ පසුතලයක් සහිතව ඉංජිනේරු ශිල්පයෙන් උපාධියකට සමාන අධ්‍යාපනික සුදුසුකම්.

(ආ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය විෂයයෙහි ඉගැන්වීමේ පළපුරුද්ද.

(ඉ) කාර්මික හා වෘත්තීය පාසැල් ක්‍රමයක් පරිපාලනයෙහි පළපුරුද්ද.

(ඊ) විශෙෂයෙන් කර්මාන්ත පිළිබඳ ආයතනයන්හි දක්නා පෘථුල කර්මාන්ත පිළිබඳ ගැටළු සම්බන්ධ දැනුමක්.

(උ) යටත් පිරිසෙයින් එක් භූගෝලීය ප්‍රදේශයකවත් වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය සම්බන්ධ ගැටළු පිළිබඳ දැනුමක් සහ වෘත්තීය හා අධ්‍යාපනය විෂයයෙහි නොදියුණු රටවල්වල ගැටළු පිළිබඳ අවබෝධයක්.

(ඌ) කාර්මික හා පරිපාලන වාර්තා පැහැදිලිව හා සංක්ෂිප්ත ලෙස කෙටුම්පත් කිරීමේ හැකියාවක් සහිතව ඉංග්‍රීසි භාෂාවේ හෝ ප්‍රංශ භාෂාවේ ව්‍යප්ත දැනුම සහ අනික් භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම. අන්‍ය භාෂාවන්ගේ දැනුම අභිමතයි.

වැටුප වර්ෂයකට අමෙරිකානු ඩොලර් 8,930.

**3. සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ස්මාරක හා කෞතුකාගාර අංශයේ ප්‍රධාන තනතුර—සියුඑ් 24**

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) නීති ශාස්ත්‍රයෙන් හෝ කෞතුකාගාර සංවිධානය හා සංස්කෘතික වස්තූන්ගේ සුරක්ෂණයට අදාල විෂයයන්ගෙන් හෝ ලද විශ්ව විද්‍යාලයීය උපාධියක්. ශිෂ්ඨත්ව ශාස්ත්‍රයන්ගේ පෘථුල දැනුම. කෞතුකාගාර හා ස්මාරක සම්බන්ධ විවිධ ක්‍රියාකාරිත්වයන්ගේ පළපුරුද්ද,

(ආ) යටත් පිරිසෙයින් එක් රාජ්‍ය භාෂාවකින් පූර්ණ දැනුමක් හා අනික් භාෂාව පිළිබඳ මනා දැනුමක්. අන්‍ය භාෂාවන් පිළිබඳ දැනුමද වැදගත් සුදුසු කමකි.

වැටුප වර්ෂයකට අමෙරිකානු ඩොලර් 10,650 යි.

වැටුප හා දීමනාවල් ප්‍රධාන වශයෙන් ගෙවනු ලබන්නේ ප්‍රංශ රාජ්‍යයෙහි ව්‍යවහාර වන ෆ්‍රැන්ක් කාසියෙනි. මෙම වැටුප් සාමාන්‍යයෙන් එක එල්ලේ අයබදු අයකිරීමෙන් නිදහස්ය. මෙබඳු වේතනවලින් ආදායම් බදු අයත් කරන්නේ නම් කායසී මණ්ඩල ව්‍යවස්ථා අනුව එය ආපසු ගෙවනු ලැබේ.

මෙම තනතුරුවලට තෝරා පත් කිරීම කරනු ලබන්නේ ජාත්‍යන්තර තත්ත්වයෙනි. කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශයේ යුනෙස්කෝ ලේකම් කායසීලයෙන් ලබාගත හැකි මේ සඳහා නියමිත ඉල්ලුම් පත්‍රවල ලියා ස්වකීය ඉල්ලුම් පත් අවශ්‍ය උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය විසින් එවිය යුතුවේ. ඉල්ලුම් පත්‍රයට අඟල් 2 1/2 × 2 1/2 ප්‍රමාණයේ කුඩා ඡායාරූපයක් ඇමිණිය යුතුවේ.

අවශ්‍ය උසස් අධ්‍යාපන සුදුසුකම්වලට අනුකූලවන ඉල්ලුම් පත්‍ර ගැන පමණක් සලකා බලනු ලැබේ. ජූලි මස 15 වැනි දිනට පසු නොවී මාවෙත ලැබෙන පරිදි රෙජිස්ටර් තැපෑලෙන් ඉල්ලුම් පත් එවිය යුතුයි.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

1964 ජූනි මස 29 වැනි දින,
58, සිරිමතිපාය,
ශ්‍රී මත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3.

7-202—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල උපදේශක තනතුරු

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල උපදේශක තනතුරු 2 ක් සඳහා අයදුම්පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනය කරමි. මෙහි පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම් පත් වර්ෂ 1964 ජූලි 17 වැනි දිනට හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

**2. වැටුප්.**—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය :—

(අ) සාමාන්‍ය උපාධිධරයන් සඳහා—රුපියල් 2,700න් පටන්ගෙන රුපියල් 120×10ක් හා රුපියල් 180×7ක් යන වාර්ෂික වැඩිවීම් ඇතිව රු. 5,160 තෙක් නගී.

(ආ) ගෞරව උපාධිධරයන් සඳහා—රුපියල් 3,180න් පටන්ගෙන රුපියල් 120×10ක් හා රුපියල් 180×7ක් යන වාර්ෂික වැඩිවීම් ඇතිව රුපියල් 5,640 තෙක් නගී.

**3. සේවයේ කොන්දේසි.**—(i) මේ තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරුවල වැඩ භාරගන්නා ලෙස තෝරා ගත් අපේක්ෂකයනට නියම කරනු ලැබේ. වහාම ඔවුන් අවශ්‍ය වනුයේ පහත සඳහන් කච්චේරි ප්‍රදේශයන් ගෙන් කවර එකකට හෝ පත් කිරීම පිණිස ය :—

යාපනය, මන්නාරම, ත්‍රිකුණාමලය, වවුනියා හෝ මඩකලපුව.

(iii) මොවුනට බාර කටයුතු නම් ප්‍රධාන වශයෙන් රජයේ නිල ධාරීන්ට රාජ්‍ය භාෂාව ඉගැන්වීම සඳහා පාඩම් මාලා සකස් කිරීම, පන්ති සංවිධානය කිරීම හා සිංහල පුහුණු කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කරනු ලබන පරිදි වෙනත් කටයුතුවලදී සහාය වීමද වේ.

**4. අවශ්‍ය සුදුසුකම්.**—හැම අයදුකරුවෙකුම—

(අ) සිංහල, පාලි, සංස්කෘත භාෂාවන්ගෙන් විෂයයක් සමග පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හා මනා සේ සිංහල භාෂා දැනුමක් ඇත්තකු විය යුතුය.

(ආ) ගුරු වෘත්තියේ පළපුරුද්ද විශෙෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(ඇ) 1964 ජූලි 17 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුය. දැනට ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට මේ වයස් සීමාවන් අදාල නොවේ.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකුම විසින් පහත පෙනෙන සහතික වල පිට පත් (මුල් පිටපත් නොවේ) තම අයදුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ත්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. (බෞතිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ.

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්,

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍ය තාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන් ගෙන් මේ බලාපොරොත්තු නොවේ).

**සැලකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, ඒ අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළහොත් ද පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හට ය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයෙහි පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම පිළිබඳ වූද, පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක් ම මෙහි ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් බාරගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් තැනට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකනු නොලැබේ.

තත්දදේව විජේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1964 ජූලි 3,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, ඊඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල උපදේශක තනතුරු පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1964 ජූලි 17 වැනි දිනට සම්පූර්ණ වයස—
   අවුරුදු :——, මාස :——, දවස් :——.
   (ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ හෝ වයස පිළිබඳ විශෙෂ සහතිකයේ පිටපතක් අමුනා එවිය යුතුයි) :————.

4. රටවැසිභාවය සහ එය කෙසේ හිමි වී ද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) පියාගේ උපන් දින සහ ස්ථානය :————.
   (ඉ) ඔහුගේ රටවැසිභාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) :————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි. සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි.) :————.
   (ආ) සිංහල, පාලි, සංස්කෘත භාෂාවෙන් එකක් සමග සාමාර්ථ්‍යය ලත් උසස්ම විභාගය :————.
   සිංහල පිළිබඳ ප්‍රවීණතාව :————.

9. ගුරු වෘත්තියේ පළපුරුදුකම් තිබේ නම් දින සමග විස්තර සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳව වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.
    (ආ) රජයේ සේවයේ යෙදී සිටී නම් තත්ත්වයත්, වාර්ෂික වැටුපත් සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි.) :—
    (i) :————.
    (ii) :————.
    (iii) :————.

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතුයි. මෑතකදී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි.) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග ; නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙලිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළිවුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැති ව මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටින බව ද, මේ අයදුම් පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-133—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### වෘත්තීය ගණිත් බැලීමේ වැඩ පිළිබඳ උපදේශක තනතුර

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ වෘත්තීය ගණිත් බැලීමේ වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් හා අනතුරුව රු. 180වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ. රුපියල් 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. වෘත්තීය ගණිත් බැලීමේ වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙය අදාල නොවේ).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය, සහ

(iv) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ගුරු සහතිකය (යාන්ත්‍රික විද්‍යාව) හෝ

(vi) පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මධ්‍ය පරීක්ෂණ සහතිකය, හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.**—පත්කරගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය,

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජූනි 27 වෙනි දින.

#### ආදර්ශ ආකෘති පත්‍රය

**ලං. කා. වි. දෙ. වෘත්තීය ගණිත් බැලීමේ වැඩ පිළිබඳ උපදේශක තනතුර**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) නිත්‍ය ලිපිනය :————.

(3) වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

(4) ජාතිය :————.

(5) උපන් ස්ථානය : (අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා : ————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නො උපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

(6) විවාහක හෝ අවිවාහක බව :————.

(7) දැන්වීමෙහි පළකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිට පත් ඇමිණිය යුතුයි) :————.

(8) ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

(9) පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

(10) ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද ? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

(11) චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

(12) දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතිකකර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත් වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-167/1--64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### විදුලි කම්බි සවි කිරීම පිළිබඳ උපදේශක තනතුර

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ විදුලි කම්බි සවි කිරීම පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් හා අනතුරුව රු. 180වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ. රුපියල් 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. විදුලි කම්බි සවි කිරීම පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු 40ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙය අදාල නොවේ).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ
(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ
(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය. සහ

(iv) විදුලි ස්ථාපනය (ඉන්සටොලේෂන්) වැඩ පිළිබඳ ලන්ඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයේ සහතිකය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ විදුලි ඉංජිනේරු සන්ධ්‍යා පන්ති සහතිකය, හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි හා යාන්ත්‍රික) සහතිකය, හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.**—පත්කරගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශකළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).
(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය,
(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජූනි 27 වෙනි දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

**ලං. කා. වි. දෙ. විදුලිකම්බි සවිකිරීම පිළිබඳ උපදේශක තනතුර**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) නිත්‍ය ලිපිනය :————.

(3) වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

(4) ජාතිය :————.

(5) උපන් ස්ථානය : (අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා : ————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නො උපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

(6) විවාහක හෝ අවිවාහක බව :————.

(7) දැන්වීමෙහි පළකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිට පත් ඇමිණිය යුතුයි) :————.

(8) ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

(9) පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

(10) ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද ? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

(11) චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

(12) දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතිකකර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත් වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද ඉතාදාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-167/2—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### ලෝහ වැඩ පිළිබඳ උපදේශක තනතුර

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ ලෝහ වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් හා අනතුරුව රු. 180වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ. රු. 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. ලෝහ වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට එය අදල නොවේ).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ
(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ
(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(iv) යන්ත්‍රහල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලන්ඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්" ආයතනයේ සහතිකය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු සහතිකය, හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය (යාන්ත්‍රික හා විදුලි), හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.**—පත්කරගනු ලබන්නා සැහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසු ගම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශකළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය,

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඈස්. ඈල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජූනි 27 වෙනි දින.

ආදර්ශ ආකෘති පත්‍රය

**ලං. කා. වි. දෙ. ලෝහ වැඩ පිළිබඳ උපදේශක තනතුර**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

(2) නිත්‍ය ලිපිනය :———.

(3) වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :———.

(4) ජාතිය :———.

(5) උපන් ස්ථානය : (අ) අයදුම්කරු :———.
(ආ) අයදුම්කරුගේ පියා :———.
(ඇ) අයදුම්කරුගේ සීයා :———.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා : ———.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

(6) විවාහක හෝ අවිවාහක බව :———.

(7) දැන්වීමෙහි පළකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිට පත් ඇමිණිය යුතුයි) :———.

(8) ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :———.

(9) පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර ———.

(10) ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :———.

(11) චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරා තිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :———.

(12) දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :———.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතිකකර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස් සකු වන බව හා පත් වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතු වන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

7–167/3—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### ලී වැඩ පිළිබඳ උපදේශක තනතුර

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ ලී වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජුලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් හා අනතුරුව රු. 180 වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ. රු. 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිළධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. ලී වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සැම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු 40ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙය අදාල නොවේ).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය ; සහ

(iv) වඩු ශිල්පය හෝ දැව කැපීමේ යාන්ත්‍රික වැඩ පිළිබඳ ලන්ඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයේ සහතිකය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ (යාන්ත්‍රික ඉංජිනේරු) සන්ධ්‍යා සහතිකය, හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිළධාරීන්ගේ (යාන්ත්‍රික ඉංජිනේරු) සහතිකය, හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.** පත්කරගනු ලබන්නා සැහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5කට අඩු පලපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,420ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පලකර තිබෙන රජයේ තනතුරු සඳහා පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජූනි 27 වෙනි දින.

## ආදර්ශ ආකෘති පත්‍රය

### ලං. කා. වි. දෙ. ලී වැඩ පිළිබඳ උපදේශක තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය : (අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිනිය යුතුයි) :————.

8. ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

9. පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

10. ඔබ රාජකීය හමුදුවක සේවය කර තිබේද ? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන්කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-167/4—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### කාර්මික චිත්‍ර ඇඳීම පිළිබඳ උපදේශක තනතුර

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ කාර්මික චිත්‍ර ඇඳීම පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් හා අනතුරුව රු. 180වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ. රු. 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. කාර්මික චිත්‍ර ඇඳීම පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු 40ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙය අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ; හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය ; සහ

(iv) යන්ත්‍ර ශාලා ඉංජිනේරු ශිල්පය හෝ වඩු ශිල්පය සහ වැද්දුම් පිළිබඳ ලන්ඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයේ සහතිකය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු සහතිකය, හෝ

(vi) පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා ඉංජිනේරු පිළිබඳ මධ්‍ය පරීක්ෂණ සහතිකය, හෝ

(vii) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි හා යාන්ත්‍රික) සහතිකය, හෝ

(viii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.**—පත්කරගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5කට අඩු පලපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පලපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,420ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(සැලකිය යුතුයි.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පලකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජූනි 27 වෙනි දින.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ලං. කා. වි. දෙ. කාර්මික චිත්‍ර ඇඳීම පිළිබඳ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

2. නිත්‍ය ලිපිනය :———.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය) :———.

4. ජාතිය :———.

5. උපන් ස්ථානය : (අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ සීයා :———.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :———.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :———

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිනිය යුතුයි) :———.

8. ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :———.

9. පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර : ———.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද ? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :———.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :———.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :———.

මේ අයදුම් පතෙහි සඳහන්කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

7-167/5—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

**යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර**

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් හා අනතුරුව රු. 180වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ. රුපියල් 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු 40ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙය අදල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය. සහ

(iv) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු විද්‍යා උපාධියක් ලබා තිබීම (ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලත් අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ). හෝ

(v) යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ වෘත්තීය (Professional) විභාගයන්හි 1 වැනි, 2 වැනි සහ 3 වැනි කොටස් සමත්වීම (ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලත් අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ), නැතහොත්

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ (යාන්ත්‍රික ඉංජිනේරු) සන්ධ්‍යා සහතිකය සහ 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම (පහත සටහන බලන්න), හෝ

(vii) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය සහ 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් තිබීම (පහත සටහන බලන්න), හෝ

(viii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.**—(vi), (vii) සහ (viii) යටතේ පත්කරගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5කට අඩු පලපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබාගන්නා තෙක් වසකට රු. 3,420ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පලකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්‍ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 ජූනි 27 වෙනි දින.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ලං. කා. වි. දෙ. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය : (අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිනිය යුතුයි) :————.

8. ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

9. පාසැල හැර යාමෙන් පසු කල රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන්කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–167/6—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

**ගණිතය පිළිබඳ උපදේශක තනතුර**

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ ගණිතය පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් හා අනතුරුව රු. 180 වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ. රුපියල් 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම සහිත වේ.

3. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම තුන් අවුරුදු කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත්කර ගනු ලැබේ.

4. ගණිතය පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(i) 1964 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට එය අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ;

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය ; සහ

(iv) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය හා ව්‍යවහාරික ගණිතය සහිත විද්‍යා උපාධියක් ; හෝ

(v) සමාන හෝ උසස් සුදුසුකම්.

සටහන.—ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුදුකම් තිබීම අතිරේක සුදුසුකමක් වේ.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(සැලකිය යුතුයි.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය.)

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්‍ෂ.

1964 ජූනි 27 වෙනි දින,
ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ ගණිතය පිළිබඳ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. දැන්වීමෙහි පළකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිනිය යුතුයි) :————.

8. ඉගෙනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

9. පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද ? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි.) :————.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7 167/7—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

ඉංජිනේරු කොට්ඨාශයේ පහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස ලංකාවේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

(1) I වෙනි පංතියේ පෝර්මන්වරුන්

(2) II වෙනි පංතියේ පෝර්මන්වරුන්.

2. **I වෙනි පංතියේ පෝර්මන්වරුන්.**

**පඩි ක්‍රමය.**—(සියළු දීමනා ඇතුළුව) මසකට : රු. 350—15×15—රු. 575. රුපියල් 440 ට හා රු. 515 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම්.

3. **සුදුසුකම් :**

(අ) **වයස.**—1964.6.1 වෙනි දට අවුරුදු 25 ත් 45 ටත් අතර විය යුතුයි.

(ආ) **අධ්‍යාපන සුදුසුකම්.**—කණිෂ්ඨය හෝ ඊට උසස් විභාගයකින් සමර්ථවීම.

(ඇ) **පළපුරුද්ද.**—

i. අවුරුදු 4 ක ආධුනිකත්වය හා පිළිගත් ගරාජයක ඔටෝමොබයිල් ඉංජිනේරු කර්මය පිළිබඳ අඩු වශයෙන් 8 අවුරුද්දක්වත් පළපුරුද්දක් තිබීම.

හෝ

ii. ඔටෝමොබයිල් කර්මය පිළිබඳ 15 අවුරුද්දක පළපුරුද්දක්. ඉන් අවුරුදු 5 ක් පරිපාලන තනතුරක සිටිය යුතුය. යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, බොඩි අළුත්වැඩියා කිරීම හා වැඩපොළවල සාමාන්‍ය කර්තව්‍යයන් ඇතුළුව ඩීසල් ඔටෝමොබයිල් කර්මය ගැන පළපුරුද්දක් තිබීම.

සැ. යු. මණ්ඩලීය සේවයේ සහකාර පෝර්මන්වරුන් වශයෙන් අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළ අයවලුන්ට මේ සඳහා අයදුම්පත් එවීමට සුදුස්සෝය.

4. **II වෙනි පංතියේ පෝර්මන්වරුන්**

**පඩි ක්‍රමය.**—(සියළු දීමනා ඇතුළුව) මසකට රු. 250—15 × 10—රු. 400. රුපියල් 340 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම.

5. **සුදුසුකම් :**

(අ) **වයස.**—1964.6.1 වෙනිදට අවුරුදු 25 ටත් 35ටත් අතර විය යුතුයි.

(ආ) **අධ්‍යාපන සුදුසුකම් :**

i. කණිෂ්ඨය හෝ ඊට සමාන විභාගයකින් සමර්ථවීම.

හෝ

ii. කිනම් භාෂාවකින් 6 වෙනි ප්‍රමාණය සමර්ථවීම. මෙය ඉහත ඇති (ඇ) (ii) ඡේදයේ සඳහන් පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට පමණි.

(ඇ) **පළපුරුද්ද :**

i. අවුරුදු 4 ක ආධුනිකත්වය හා පිළිගත් ගරාජයක ඔටොමොබයිල් ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ අඩු වශයෙන් 4 අවුරුද්දකවත් පළපුරුද්ද තිබීම.

හෝ

ii. ඔටොමොබයිල් කර්මාන්තය පිළිබඳ 10 අවුරුද්දක පළපුරුද්දක්. ඉන් අවුරුදු 2 ක් පරිපාලන තනතුරක සිටිය යුතුයි. යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, බොඩි අළුත්වැඩියා කිරීම, හා වැඩ පොළවල සාමාන්‍ය කර්තව්‍යයන් ඇතුළුව ඩීසල් ඔටොමොබයිල් කර්මය ගැන පළපුරුද්දක් තිබීම.

6. **සේවා කොන්දේසි.**—තේරෙන අපේක්ෂකයෝ පළමුකොට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබෙත්. ඔවුන් විසින්—

(අ) පත්වීමට කලින් ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතාව ගැන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

(ආ) දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවන්නාවූ මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.

(ඇ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රවාසන කාලය තුළදී මණ්ඩලය විසින් නියම කරන ලද ප්‍රමාණ දක්වා සිංහල ප්‍රවීණතාව ලබාගත යුතුයි.

(ඈ) ඔවුන්ගේ පඩියෙන් සියයට 4 ක් මණ්ඩලීය අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුයි. මණ්ඩලයෙන් එම අරමුදලට සියයට 6 ක් ගෙවනු ලැබේ.

(ඉ) ලංකාවේ සෑම පළාතකම සේවය කළ යුතුයි.

7. කොයි අපේක්ෂකයා විසිනුත් පහත සඳහන් විස්තර සැපයිය යුතුයි :—

(අ) වයස, අධ්‍යනික හා වෛඩික සුදුසුකම්, ප්‍රායෝගික අභ්‍යාසය හා පළපුරුද්ද.

(ආ) පාඨශාලාවෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් පිළිබඳ විස්තර, ලැබුණු පඩි හා දැරූ තනතුරු සහිතව.

(ඇ) මීට කලින් මණ්ඩලීය සේවාවේ යම් තනතුරක් ඉල්ලුවේද යන බව හා ප්‍රතික්ෂේප කළේද යන බව.

(ඈ) තමා උසාවියකදී ක්‍රිමිනල් වරදකට වරදකරුවකු වී සිටියේද යන බව සඳහන් කරන්න. එසේ සිටියේ නම් ඒ පිළිබඳ විස්තර.

8. කොයි අපේක්ෂකයා විසිනුත් තමා සඳහන් කළ විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමින් තම ඉල්ලුම් පත්‍රයෙහි ප්‍රකාශයක්ද කළ යුතුයි. එහි සඳහන් වූ යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් සොයා ගත හොත් එයින් තමා නුසුදුස්සකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව සොයාගත හොත් වන්දියක් නොමැතිව තමා සේවාවෙන් පහකර දමනු ලැබිය හැකි නියාව තමා දන්නා බවත්.

9. ඉල්ලුම්කරුවන් විසින් තමන් ගැන තොරතුරු දැනගත හැකි දෙදෙනෙකුගේ නම්ද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි. උප්පැන්න සහතික ය, අධ්‍යයනික සහතික පත්‍ර ය, යෝග්‍යතා සහතික පත්‍ර ය යන මේ ආදියේ පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.

10. ඉල්ලුම් පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය සේවක මණ්ඩල කළමනාකාර මහතා වෙත 1964 ජූලි මස 20 වෙනිදට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි. ඉල්ලුම් පත්‍රය දමා එවන කවරයේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුයි. 1964 ජූලි මස 20 වෙනිදට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාර තැන.

සේවක මණ්ඩල කොට්ඨාසය,
ලංකා ගමනාගමන මණ්ඩලය,
කොළඹ 5.
1964 ජූනි මස 22 වෙනි දින.

7-54—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

(ඇ) **උප කාරක කාර්මිකසේවා පරීක්ෂණය.**—පළමුවැනි දෙපාර්තමේන්තු පරීක්ෂණයට පෙනී සිටීමට ආධුනිකයින් සුදුසුකම් ලබන අතර උපකාරක කාර්මික සේවයේ III වැනි ශ්‍රේණියට පත්වීමක් ලැබීමට සුදුස්සෙක් ද වෙනවා ඇත.

**සටහන.**—ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ II වැනි පාඨමාලාව (විදුලි හා යාන්ත්‍රික අංශය) සමර්ථ ආධුනිකයින් පළමුවැනි දෙපාර්තමේන්තු පරීක්ෂණයේදී පහත දැක්වෙන විෂයයන්ගෙන් නිදහස් කරනු ලබනවා ඇත :—

I වැනි කොටස—(i) ව්‍යවහාරික විදුලිය.

(ii) සැලැස්ම ඇඳීම හා පිටපත් කිරීම.

II වැනි කොටස—වැඩපල පළපුරුද්ද.

(ඉ) පළමුවැනි දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් ආධුනිකයෙක් සම්පූර්ණ අභ්‍යාස කාලසීමාව අවසාන කිරීමෙන් හා ඇබෑර්තු ඇතිවීම අනුව උප කාර්මික සේවයේ III වැනි ශ්‍රේණියේ විදුලි ෆෝර්මන් ධුරයෙහි පත් කරනු ලැබීමට සුදුසුකම් ලබනවා ඇත.

(ඊ) **උපකාරක කාර්මික සේවයේ උසස් කිරීම්.**—උප කාරක කාර්මික සේවය සඳහා වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමයෙහි සඳහන් පරිදි උසස් ශ්‍රේණිවලට උසස් කරනු ලැබේ. මෙය එකී නියමිත ශ්‍රේණිවල ඇබෑර්තු ඇතිවීමට යටත්ව සිදු කෙරේ.

(උ) **විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකරුගේ තීරණ.**—ආධුනික අභ්‍යාසය සම්බන්ධව ඕනෑම කරුනකදී රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරුගේ තීරණය අවසාන තීරණය වනවා ඇත.

6. රජයේ සේවයේ නියුක්ත අයවලුන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එව්වහොත් පමණක් සලකා බලනු ලැබේ.

7. අයදුම්කරුවන් තම අයදුම් පත් සමඟ මෙහි පහත දැක්වෙන සහතික පත් වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි :—

(අ) ලබා ඇති උසස් අධ්‍යාපන සහතිකය.

(ආ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතිකපත් තුනක්.
(**සටහන.**—මෙම චරිත සහතික පිටපතක් ආපසු නොඑවනු ලැබේ.)

8. අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධ වෙනත් ලිපි කොළඹ, තැපැල් පෙට්ටිය 540, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරු යන ලිපිනයට එවනවා මිස, පුද්ගලික වශයෙන් දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරියෙකුට නොවේ.

9. නියමිත වේලාවක හා ස්ථානයකදී අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි. ගමන් හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි ප්‍රසිද්ධ කර ඇති රජයේ තනතුරු වලට පත් කිරීම පිළිබඳ බලපාන සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ඇම්. මුතුබාලසූරියර්,
වැ. බ. ප්‍රධාන කළමනාකරු,

රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 540,
කොළඹ.

## අයදුම් කිරීමේ ආකෘති පත්‍රය

**.......................තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) ————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. ........................................ ......... වැනි දිනට නියමිත වයස
   අවුරුදු :————, මාස :————, දින :............

4. උපන් දිනය :————.

5. පුරවැසි බව සහ ලබාගත් අන්දම :————.
   පහත සඳහන් අයගේ උපන් ස්ථානය සඳහන් කරන්න :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

අයදුම්කරු ලංකාවේ උපන්නේ නම්, (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම්, (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඈ) වෙනම පිරවිය යුතුයි.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹු භාවය :————.
   (විවාහක නම්, විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න.)

7. (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.
   (ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා :————.

ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල, ඒවාට ඇතුලත් වූ හා අස්වූ දිනයන් සමග :————.

8. අධ්‍යාපනික සුදුසුකම් (ලබා ඇති උපාධි සහ ඒවා ලබාගත් දින, පංතිය සහ ඉදිරිපත් වුණු විෂයයන් සඳහන් කරන්න). අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි :————.

9. ලබාඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම්, යමක් ඇතොත් දින සමග (පිළිගත් ආයතනවල සාමාජිකත්වය ලැබූ ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකමක් ඇතොත් ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) : ————.

10. පාසැල හෝ විද්‍යාල හැරයාමෙන් පසු කළ රක්ෂා නියුක්තව සිටි හා හැරගිය දින සමග ලද වැටුප් ————.

11. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් : ————.

12. ඔබ ගැන කරුණු දැන ගැනීමට හැකි අයවලුන් තිදෙනෙකුගේ නම්, ලිපිනය හා නිලතල :————.

13. චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

14. ඔබ ණය ගැති කමින් නිදහස්ද ? නොඑසේ නම් කොතෙක් දුරට ණය ගැතිද ? :————.

15. ඔබ සතුව මෝටර් රියක් තිබේද ? නැතහොත් මෝටර් බයිසිකලයක් පැදිය හැකි ද ? :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැන ගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත්කරගනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7—115—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුව

### භාරතීය නැටුම් පිළිබඳ උපදේශක තනතුර

ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුවේ භාරතීය නැටුම් පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි මස 17 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන පරිදි එවිය යුතු යි.

3. **වැටුප් ක්‍රමය :**

මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 1,860 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් පසුව රු. 2,820 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ.

4. **බඳවා ගැනීමේ කොන්දේසි :**

මේ තනතුර විශ්‍රාම වැටුප් රහිත ස්ථිර තනතුරකි. පත්වීම තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) සෑම අයදුම්කරුවකුම 1964 ජූලි මස 17 දිනට වයස අවුරුදු 40 ට වැඩි නො විය යුතු යි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටිය අය කෙරෙහි උපරිම වයස් සීමාව බලපාන්නේ නැත) ;

(ආ) විශිෂ්ට චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුයි ;

(ඈ) සිංහල භාෂාවෙන් ඉගැන්වීමට සහ වාර්තා තැබීමට හැකිවන දැනීමක් තිබිය යුතුයි. යටත් පිරිසෙයින් 7 වැනි ප්‍රමාණයෙන් සමත්වීම අවශ්‍යයි ;

(ඇ) ඉන්දියාවේ රුක්මණී අරුන්ඩේල් විද්‍යාලයේ හෝ භාරතීය නැටුම් උගන්වන ඒ හා සමාන වෙනත් ආයතනයක හෝ ඩිප්ලෝමා උපාධියක් තිබිය යුතුයි. දිවයිනේ නාට්‍ය සංදර්ශන ආදිය පවත්වා ඒ පිළිබඳ ප්‍රසිද්ධියක් හා පළ පුරුද්දක් තිබිය යුතුයි.

භාරතීය නැටුම් පිළිබඳ ඉතා හොඳ දැනීමක් තිබිය යුතුයි. කතකාලී, මනිපුරි, කතක් හා ඉන්දියානු ගැමි නැටුම් පිළිබඳ දැනීම අතිරේක සුදුසුකමක් හැටියට ගණන් ගනු ලැබේ.

6. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත්වලට පහත සඳහන් ලිය කියවිලිවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) ලබා ඇති උසස් ම අධ්‍යාපනික, ශාස්ත්‍රී හා වෘත්තිය සහතික ;

(ආ) අයදුම්කරුවන්ගේ චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික 3ක්. (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍ය ය).

7. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලැබ, නියමිත දිනට පසුව මෙම කයාර්‍යාලයට ලැබෙන අයදුම් පත් ගැන සලකා බලන්නේ ඒවා නියමිත දිනට පෙර දෙපාතර්මේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් හා ප්‍රමාදයට සෑහෙන හේතු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගත යුතු ය යි නිර්දේශ කරන්නේ නම් පමණී.

8. අයදුම් පත් මගේ නමට හෝ මෙම දෙපාතර්මේන්තුවේ කිසිම නිලධාරියකුගේ නමට හෝ නොව "වැඩ බලන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික කලායතනය, හෝර්ටන් පෙදෙස, කොළඹ 7" කියා එවිය යුතුයි. යම් ඉල්ලුම්කරුවකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැත් විමකට හෝ උත්සාහයක් දැරුවහොත් ඒ හේතුවෙන් ම එකී අයදුම්කරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

9. අයදුම්කරුවන් යම්කිසි ස්ථානයකදී සහ වේලාවකදී සුදුසු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය වනු ඇත. ඉල්ලුම් පත්වලට අමුණා එවන ලද සහතික පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු යි. පරීක්ෂණය සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා හෝ ගෙවනු නො ලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි ඇති රාජ්‍ය සේවා තනතුරු පත්වීම් සඳහා අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

11. සියලුම අයදුම් පත් ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

ගාමිණී විජයවර්ධන,
වැ. බ. අධ්‍යක්ෂ.

1964 ජූනි මස 26 දින,
කොළඹ 7,
හෝර්ටන් පෙදෙසේ,
ශ්‍රී ලංකා ජාතික කලායතනයේදී ය.

## ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුව

### භාරතීය නැටුම් පිළිබඳ උපදේශක තනතුර

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) (අ) 1964 ජූලි මස 17 වෙනි දාට වයස :——, අවු :——, මාස :——; දින :——.

(ආ) උපන් දිනය :————.
(දැන් වූ විටක උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු යි.)

(4) ජාතිය :————.

(5) උපන් ස්ථානය :————.

(6) අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතු යි)

(7) ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතු යි)

(8) පළපුරුද්ද :————.

(9) දැනට රජයේ සේවයේ නම්, ඒ පිළිබඳ විස්තර :————.

(10) පාසැල හැර යාමෙන් පසු කළ රක්ෂාවල් හා ඒවායේ විස්තර :————

(11) චරිත සහතික ලබාගෙන ඇති පුද්ගලයින්ගේ නම්, තනතුරු හා ලිපිනයවල් :————.

මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බව ද, මෙයින් සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි සහිත බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බව ද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නො ගෙවා සේවයෙන් පහ කරනු ලබන බව ද, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–106—64.7 3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුව

### සංගීත උපදේශක (අනියම්) තනතුර

ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුවේ සංගීත උපදේශ (අනියම්) තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූලි මස 17 වෙනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන පරිදි එවිය යුතුයි.

**3. වැටුප් ක්‍රමය.—**

සියලුම දීමනා ඇතුලත් ව දිනකට රු. 20 ක පාරිශ්‍රමිකයන් වැඩ කරන එක් දිනයක් වෙනුවෙන් ගෙවනු ලැබේ.

**4. බඳවා ගැනීමේ කොන්දේසි.—**

මෙය හුදෙක් අනියම් පදනමක් මත වූ පත්වීමකි. මෙම පත්වීම හේතුවෙන් රජයේ ස්ථිර හෝ තාවකාලික පත්වීමක් සඳහා මොනම අන්දමකින් වත් හිමිකමක් හෝ රජයේ ආයතනයක ස්ථිර හෝ තාවකාලික පත්වීමක් ලැබීමට විශේෂ හිමිකමක් හෝ නො ලැබේ. ස්ථිර පත්වීමක් කළ විගස හෝ අනියම් උපදේශකයාගේ සේවය අනවශ්‍ය වූ විගස හෝ තෝරා ගත් අයදුම් කරුගේ සේවය කෙළවර කරනු ඇත.

**5. සුදුසුකම් :—**

(1) සෑම අපේක්ෂකයෙකු ම 1964.7.17 දිනට වයස අවුරුදු 20 ට අඩු නො විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නො විය යුතුයි.

(2) භාත්ඛණ්ඩ සංගීත විද්‍යා පීඨයේ හෝ සම තත්ත්වයේ සංගීත ආයතනයක විශාරද උපාධියක් ලබා හෝ ශ්‍රී ලංකා ජාතික කලායතනයේ උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ සය අවුරුදු සහතිකය ලබා හෝ සිටිය යුතුයි. අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්දක් අවශ්‍ය වේ. සිංහල භාෂාවෙන් ඉගැන්වීමට සහ වාර්තා තැබීමට හැකිවන දැනීමක් තිබිය යුතුයි. යටත් පිරිසයෙන් කණිෂ්ඨ පන්තිය ඉක්මවා සිටිය යුතුයි.

6. මෙම ගැසැට් පත්‍රයේ I වෙනි කොටසේ II ඡේදය ආරම්භයේ දැක්වෙන රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි බලන්න.

ගාමිණී විජයවර්ධන.
වැ. බ. අධ්‍යක්ෂ.

1964. 6. 23,
කොළඹ 7,
හෝර්ටන් පෙදෙස,
ශ්‍රී ලංකා ජාතික කලායතනය.

## ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුව

### සංගීත උපදේශක (අනියම් තනතුර)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. (අ) 1964.7.17 දිනට වයස : අවුරුදු :——, මාස :——, දින :————.
   (ආ) උපන් දිනය :————.
   (දන්වූ විටක උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුයි)
4. ජාතිය :————.
5. උපන් ස්ථානය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
7. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
8. පළපුරුද්ද :————.
9. දැනට රජයේ සේවයේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
10. චරිත සහතික ලබාගෙන ඇති පුද්ගලයින්ගේ නම් තනතුරු හා ලිපිනයවල් :————.

මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි සහිත බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුසු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-66—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ටයර් සංස්ථාව

### මුරකරුවන් සඳහා ඇබෑර්තු

මුරකරුවන්ගේ තනතුරු සඳහා ලංකා ටයර් සංස්ථාව, ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

**සුදුසුකම් :**

(අ) 1964.8.1 වැනි දිනට වයස අවුරුදු 25–45 අතර වියයුතුය.
(ආ) පිලිගත් ආයතනයක දී හෝ වෙළඳ සමාගමක දී ලබාගත්, අඩු වශයෙන් අවුරුදු 5ක පලපුරුද්ද.
(ඇ) අඩු වශයෙන් සිංහල 7 සමර්ථවී හොඳින් සිංහල ලිවීමට හා කියවීමට පුලුවන් විය යුතුය. සුලු වශයෙන් ඉංග්‍රීසි දැනීම අතිරේක සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.
(ඈ) තුවක්කු බලපත්‍රයක් තිබිය යුතුය.
(ඉ) යුද හමුදාවේ හෝ පොලිස් හමුදාවේ හෝ සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :**

පහත සඳහන් සියලු දීමනා අඩංගු මාසයක වැටුප් පරිමාණය යටතේ ආරම්භක වැටුප හෝ සුදුසු පියවරක වැටුපක් ගෙවනු ලැබේ.

රු. 120 — 2 × 15—රු.150

**වැඩ කරන වේලාවල් :**

දවල් හෝ රෑ පැය 8 මුර සේවය.

අයදුම් කරුවන් ඔවුන්ගේ අයැදුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.
(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.
(ඇ) මෑතක දී ලබාගත් චරිත සහතික පත්‍ර දෙකක්.
(ඈ) කලින් සේවය කළ තැන් වලින් ලබාගත් සහතික.

රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ සංස්ථාවල සේවය කරන අය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ සංස්ථා ප්‍රධානියාගේ හෝ මාර්ගයෙන් ඉල්ලුම් කළ යුතුය.

පහත පෙනෙන ආකෘතිය අනුව සකස් කළ අයැදුම් පත්, 1964 ජූලි 10 වැනි දිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය.

ලංකා ටයර් සංස්ථාව, සභාපති.
292, ගාලු පාර, කොළඹ 3.
1964 ජූනි 29.

### අයැදුම් පත් ආකෘතිය

### ලංකා ටයර් සංස්ථාව

#### මුරකරු තනතුර සඳහා අයදුම් පත

1. ඉල්ලුම්කරුගේ නම : මුලකුරු සමග :————
   මුලකුරුවලින් කියැවෙන නම් :————
2. පෞද්ගලික ලිපිනය :————
3. උපන් දිනය හා ස්ථානය :————.
4. (අ) ඉල්ලුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පාර්ශ්වයේ මුත්තා උපන් ස්ථානය :
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පාර්ශ්වයේ මීමුත්තා උපන් ස්ථානය :
5. පුරවැසි භාවය :————.
6. විවාහක ද අවිවාහක ද යන වග :————.
7. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :
   (අ) සිංහල :————.
   (ආ) දෙමල :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
8. අධ්‍යාපනය ලැබූ පසු දැරූ තනතුරු :

| ආයතනයේ නම | තනතුර | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|

9. මේ තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් (මෙවැනි තනතුරකට ඇති විශේෂ පළපුරුද්ද ආදිය) :————.
10. ඔබ මුදල් අගහිඟකම්වලින් පෙළෙන්නෙහි නම් ඒ පිළිබඳ විස්තර :
11. ඔබේ නෑදෑයෝ හෝ ඔබ හොඳින් අඳුනන අය හෝ මේ සංස්ථාවේ සිටිත් නම්, ඒ අයගේ නම් හා තනතුරු :————.
12. ඔබ ගැන විස්තර ලබාගත හැකි දෙදෙනෙකුගේ නම්, තනතුරු හා ලිපිනයන් :————.
13. අමුණා ඇති සහතික පිටපත් දුන් අයගේ නම්, තනතුරු හා ලිපිනයන් :
14. ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව ද, තෝරාපත්කර ගැනීමට පෙර යම්කිසි අසත්‍ය භාවයක් හෝ වැරැද්දක් හෝ ගැන දැනගැනීමට ලැබුණොත් නුසුදුස්සෙකු වීමට හේතු වන බවත්, තෝරාගත් පසු එසේ දැනගතහොත්, කිසිම වන්දියක් හෝ කල්දීමක් හෝ නැතිව වහාම සේවයෙන් අස්කිරීමට බැඳී ඇති වගත් මා දන්නා බව මෙයින් සහතික කරමි.

දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

7-209—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## සේවක මණ්ඩලයේ කළමණාකාර තනතුර

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ "සේවක මණ්ඩලයේ කළමණාකාර" තනතුරු දෙකක් සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

අයදුම් කරුවන්ට පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුය :—

1. පරිපාලනය පිළිබඳ අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති උපාධිධාරියකු වීම, හෝ
2. රජයේ හෝ පිළිගත් විශාල වෙළඳ ආයතනයක කාර්‍ය සංවිධානය හා සුභසාධක කටයුතු පිළිබඳ අවුරුදු 15 ක පළපුරුද්ද, මෙයින් අඩු වශයෙන් අවුරුදු තුනක කාලයක් විධායක නිලධාරියකු වශයෙන් සේවය කොට තිබිය යුතු අතර ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් සමත් වී සිටිය යුත්තාහ.

අයදුම්කරුවන් කාර්‍ය සංවිධානය හා ශුභසාධක කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතු අතර සාප්පු සහ කාර්‍යාලීය පණත, කම්කරු ආඥා පණත් ක්‍රියාත්මක කිරීමට දැන සිටිය යුතුය.

1964.7.17 වෙනි දිනට අයදුම් කරුවන් වයස අවුරුදු 45ට වැඩි නොවිය යුතුයි. අයදුම්කරුවන් රු. 750—50—1,250 වැටුප් ශ්‍රේණික් යටතේ තිබෙන අතර රජයේ ගෙවීම් අනුව ජීවනාධාර ගෙවනු ලැබේ.

සියළුම අයදුම් පත් 1964.7.17 දින හෝ ඊට පෙර කොළඹ 2 අංක 21, වොක්ෂෝල් වීදියේ පිහිටි සතොසේ ප්‍රධාන කාර්‍යාලයේ සාමාන්‍යාධිකාරි තුමා වෙත ලැබෙන්ට සලස්විය යුතුය.

බී. වී. ඒ. ජේ. සේනාරත්න,
සාමාන්‍යාධිකාරී ආනයන.

1964.6.29.

7-173—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය.

## ජාතික ලුණු සංස්ථාව

### ගණකාධිකාරි/ලේකම් තනතුර

ජාතික ලුණු සංස්ථාවේ ගණකාධිකාරි/ලේකම් තනතුර සඳහා ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්කරුවන් 1964 අගෝස්තු 1 දිනට වයස අවුරුදු 45ට නොවැඩි, අඩුම වශයෙන් චාටඩ් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අය විය යුතු අතර රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවයක් ලබා සිටිය යුතුය.

2. මෙම තනතුර සඳහා අදාල වැටුප් ක්‍රමය මෙසේය—

(1) චාටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍ය සහතිකය දරන්නෙකුට මාසයකට සියලු දීමනා අඩංගු රු. 600—10×40—රු. 1,000 කි.

(2) චාටඩ් ගණකාධිකාරීන්ට—මාසයකට සියලු දීමනා අඩංගු රු. 1,000—10×50—රු. 1,500 කි.

3. අධ්‍යාපනික සහ පළපුරුද්ද අනුව තෝරා ගන්නා අයදුම්කරු ඉහත සඳහන් වැටුප් පරිමානයේ සුදුසු ස්ථානයක තැබීමට පුළුවන.

4. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයෙන් ලබා ගත යුතු ආකෘති පත්‍රයක විය යුතු අතර 1964 ජූලි මස 17 දිනට හෝ ඊට පෙර හෝ කොළඹ, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ අංක 110 දරණ ස්ථානයේ ජාතික ලුණු සංස්ථාවේ සභාපතිට ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. (වැඩි විස්තර සහ අයදුම් ආකෘති පත්‍ර මගෙන් ලබා ගත හැකි).

ලේකම්,
ජාතික ලුණු සංස්ථාව.

තැ. පෙ. 1334,
කොළඹ 2.

4-109—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සේවිංස් බැංකුව

### ගණකාධිකාරී තනතුර

ලංකා සේවිංස් බැංකුවෙහි ගණකාධිකාරී තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් 64.7.18 වන දින හෝ ඊට පෙර මට ලැබෙන්නට එවිය යුතුයි.

සටහන්—

(i) විශේෂ මුද්‍රිත ඉල්ලුම් පත් සපයනු නොලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුයි.

(2) **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරු තුන් අවුරුදු ආධුනිකත්වයකට යටත් වේ.

(3) **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් වැටුප වර්ෂයකට රු. 8,400 න් පටන් ගෙන රු. 480 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 4කින් යුක්තව වර්ෂයකට රු. 10,320 දක්වා වැඩිවනවා ඇත.

(4) **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) 1964.7.18 වැනිදා තමාගේ වයස අවුරුදු 27ට නොඅඩු බවත්, අවුරුදු 45 ට නොවැඩි බවත්,

(ආ) (i) වරලත්, ඒකාබද්ධ මණ්ඩල හෝ ලංකාවෙහි ලියාපදිංචි ගණකාධිකාරියකු බව, හෝ (ii) රජයේ දෙපාර්තමේන්තුවක සහ/හෝ බැංකු ව්‍යාපාර සංස්ථාවක අඩු වශයෙන් අවුරුදු 5 ක් මාණ්ඩලික තනතුරක සේවය කල රජයේ ගණකාධිකාරීන්ගේ සේවාවෙහි සාමාජිකයෙකු බව,

(ඇ). තමා විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ඈ) තමාට රාජ්‍ය භාෂාව පිළිබඳ මනා දැනුමක් ඇති බව,

(දැනට රජයේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ අයව වයස සීමාවක් නැතිව සලකා බලනු ලැබේ).

(5) පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ).

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුයි.

(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

(**සැ. යු.** 1. අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ ලියකියවිලිවල පිටපත් හෝ නොඇමිණිය යුතුයි. 2. ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.)

(6) රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුයි. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන ලිපිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයයි නිර්දේශ නොකරතොත් සලකා බලනු නොලැබේ.

(7) අයදුම් පත් හා ඒ සම්බන්ධව අනෙක් ලියකියවිලි සියල්ලක්ම ලංකා සේවින්ස් බැංකුවේ සභාපති අධ්‍යක්ෂට හැර මෙම බැංකුවේ නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

(8) මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස, (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි මෙම තනතුරටද බල පානවා ඇත.

(9) අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුලත තම අයදුම් පත ලැබුන බව් දන්වා ලිපියක් නොලත් අයදුම්කරුවකු වෙත් නම් වහාම ඒ බව ලංකා සේවින්ස් බැංකුවේ සභාපති අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

තිලක් ගුණරත්න,
සභාපති අධ්‍යක්ෂ,
ලංකා සේවිංස් බැංකුව.

ලංකා සේවිංස් බැංකුව,
එචේලන් චතුරශ්‍රය, කොළඹ 1,
1964 ජූනි 29 දින.

4-177—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුව

### උඩරට නැටුම් පිළිබඳ බාහිර උපදේශක තනතුරු

අංක 14,035 සහ 1964. 5. 15 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ 613 වැනි පිටුවේ ඉහත සඳහන් මාතෘකාව යටතේ පළවී ඇති නිවේදනයට අමතරවයි. එම නිවේදනයේ 4 (ඈ) කොටසට (අවශ්‍ය සුදුසුකම්) පසුව පහත සඳහන් කොටස එකතු කරනු ලැබේ.

(ඉ) උඩරට, පහතරට සහ සබරගමු නැටුම් පිළිබඳ විශේෂකීර්තියක් ලත්, සංදර්ශන හා තරඟවලට ඉදිරිපත් වී ඇති, නැටුම් ගුරුවරුන් වශයෙන් නම් දරන්නවුන් විය යුතුයි.

2. මෙම සුදුසුකම් දරන්නවුන් ගෙන් අයදුම් පත් (1964. 5. 15 දින ගැසට් පත්‍රයේ පළවූ ආකෘතිය අනුව) 1964. 7. 17 දින දක්වා බාරගනු ලැබේ.

3. 1964. 5. 15 දින ගැසට් නිවේදනය අනුව අයදුම් කළ වුන් නැවත අයදුම් පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

ගාමිණී විජයවර්ධන,
වැඩබලන අධ්‍යක්ෂ.

ශ්‍රී ලංකා ජාතික කලායතනය,
කොළඹ 7, 1964 ජූනි මස 27.

7-165—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### වෑන් හා ලොරි රියදුරු තනතුරු සඳහා ඇබෑර්තු

මෙම මණ්ඩලයේ උළු නිෂ්පාදන අංශයේ ඉහතකී තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. මෙම තනතුරු ස්ථිර හා සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ සහිත ඒවා වේ.

පඩි පරිමාන (මසකට සියළු දීමනා ඇතුළුව)

**වෑන් රියදුරු :** රු. 175—6 × 10—ක.ඉ. 8 × 5—රු. 275.

**ලොරි රියදුරු :** රු. 200—6 × 10—ක.ඉ. 8 × 5—රු. 300.

**අවශ්‍ය සුදුසුකම් :**

වෑන් රියදුරු—අයැදුම් කරුවන් සියළු පුද්ගලික කාර් හා තාර බර හොණ්ඩර 20 ට නොඅඩු වෑන් හා ලොරි පැදවීමට බල පත්‍රයක් හා මෝටර් යාන්ත්‍රික දැනීම හා අවුරුදු තුනක එලවීමේ පලපුරුද්දක් ඇති අයවිය යුතුය.

ලොරි රියැදුරු—අයදුම්කරුවන් සියළු පුද්ගලික කාර් හා තාරබර හොණ්ඩර 20 ට නොඅඩු වෑන් හා ලොරි පැදවීමට බලපත්‍රයක් හා මෝටර් යාන්ත්‍රික දැනීම හා අවුරුදු පහක එලවීමේ පලපුරුද්දක් ඇති අයවිය යුතුයි.

**අවශ්‍ය පොදු සුදුසුකම් :**

අයැදුම් කරුවන් වයස අවුරුදු 18 ටත් 45 වත් අතර විය යුතුය.

සිංහල ලිවීමට හා කියවීමට හැකි අය විය යුතුය.

ලංකා පුර වැසියන් විය යුතුය.

හොඳ සෞඛ්‍ය තත්වයෙන් සිටින අය විය යුතු අතර දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට කැමතී විය යුතුය.

මෙම තනතුරුවලට අයත් සේවා කොන්දේසි මෙම තනතුරුවලට අදාල නීතිගත සේවා පනත් හා මෙම මණ්ඩලයේ උළු නිෂ්පාදන අංශයේ සාමාන්‍ය සේවා කොන්දේසි අනුව සම්පාදිතය.

අයැදුම් පත්‍ර එවිය යුත්තේ ඒ සඳහා මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මගිනි. මෙම ආකෘති පත්‍ර මෙම කාර්යාලයට පැමිණ හෝ තම ලිපිනය හා තැපැල් මුද්දර යෙදූ ලියුම් කවරයක් පහත සඳහන් නිලධාරි තැනට හෝ එවීමෙන් ලබාගත හැක. මෙම ආකෘති පත්‍ර වහාම ලබා ගන්නා මෙන් අයැදුම්කරුවන්ට අවවාද කරමු. ආකෘති පත්‍ර නියමිත ප්‍රකාර සම්පූර්ණ කර ලියුම් කවරයක බහා කවරයෙහි උඩ වම් කෙළවරේ "රියදුරු තනතුරු සඳහා අයැදුම් පත" යන්න සටහන් කර පහත සඳහන් නිලධාරි තැන වෙත එවිය යුතුය. අයැදුම් පත් භාර ගන්නා අවසාන දිනය 1964 ජූලි මස 16 වැනි දින වේ.

ලේකම්.

ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
181, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

7-203—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකාවේ කෘෂිකම් සහ කර්මාන්ත ණයදෙන ආයතනය

### සහකාර යතුරු ලියන ලිපිකාර තනතුර

64.5.22 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකළ මගේ දන්වීම මගින් ඉහත සඳහන් තනතුරට ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබිණ. 1964.6.13 වෙනි දිනට වයස අවුරුදු 18 න් ඉහළ සහ අවුරුදු 21 න් පහළ එම නිවේදනයේ සඳහන් අනිත් සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගෙන්ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා බව මෙයින් දැනුම්දෙන අතර එවැනි ඉල්ලුම්පත්‍ර 64.7.17 වෙනි දින සවස 4.30 ට පෙර සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුයි.

සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. අං. 20,
කොළඹ, 64. 6. 23.

7-70—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය පාඨශාලාවල ඉංග්‍රීසි උප ගුරුවරුන් වශයෙන් සේවය කිරීමට ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය—1964

**සාමාන්‍ය.**—සිංහල මාධ්‍ය පාඨශාලාවල ඉංග්‍රීසි උප ගුරුවරුන් වශයෙන් සේවය කිරීමට ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගයක් 1964 සැප්තැම්බර් මස 12 වැනි දින විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ. විභාගය ඉංග්‍රීසි පිළිබඳ පැය $2\frac{1}{2}$ක පත්‍රයකට සීමා වන්නේය.

මෙහි දැක්වෙන ව්‍යවස්ථා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනු දැනීම ඇතිව පිළියෙල කරන ලදී.

2. **සේවා තත්ත්වය.**—ශිෂ්‍ය ගුරු පත්වීම් තාවකාලිකය. විශ්‍රාම වැටුප් එම තනතුරුවලට අයත් නැත. ඔවුන් පත් කරනු ලබන ඒ ඒ දිස්ත්‍රික්කවලට ඔවුන්ගේ සේවය සීමා වේ. ඔවුහු අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක සේවයට අයත් වෙති.

3. **සේවා කොන්දේසි.**—(1) ශිෂ්‍ය ගුරුවරයෙකු තෝරා ගනු ලබන්නේ යම් දිස්ත්‍රික්කයකටද එම දිස්ත්‍රික්කයේ පාඨශාලාවකට ඔහු/ඇය පත් කරනු ලැබේ.

(2) ශිෂ්‍ය ගුරුවරයා සේවය කරන පාඨශාලාවේ ප්‍රධානයාගේ ද, මාණ්ඩලික පරීක්ෂකගේ ද පරීක්ෂණයට ලක්වේ. ශිෂ්‍ය ගුරුවරයාගේ හැසිරීම හා සේවය පිළිබඳ වාර්තා වාරයෙන් වාරයට පළාතේ අධ්‍යාපන නිලධාරි වෙත ඔවුන් විසින් යවනු ඇත.

(3) අවුරුදු 4 ක කාලසීමාවක් තුළදී, ගුරු විභාගයකින් සමත් නොවන හෝ ගුරු විද්‍යාලයකට ඇතුළු නොවන හෝ ශිෂ්‍ය ගුරුවරුන්ගේ පත්වීම් මුල් පත්වීමේ සිට අවුරුදු 4 ඉකුත්වූ පසු අහෝසි කරනු ලැබේ.

(4) කවර අවස්ථාවක දී වුවත් වැඩ හා හැසිරීම සතුටු දයක. නොවන ශිෂ්‍ය ගුරුවරයෙකු කලින් දැන්වීමක් නොමැතිව අස්කිරීමට ඉඩ තිබේ.

(5) ජ්‍යෙෂ්ඨතාව හෝ විශ්‍රාම වැටුප් හෝ ගණන් ගැනීමේ දී, ශිෂ්‍ය ගුරු සේවය ඇතුලත් කරනු නොලැබේ.

4. **දීමනා.**—මසකට රු. 100 ක් දීමනාවක් වශයෙන් ශිෂ්‍ය ගුරුවරයෙකුට ගෙවනු ලැබේ. මෙයට අමතරව කිසිම මුදලක් ශිෂ්‍ය ගුරුවරයෙකුට ගෙවනු නොලැබේ.

5. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(i) ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) 1964 ජූලි මස 15 වැනි දින දී වයසින් අවුරුදු 18 ට වැඩි විය යුතුය අවුරුදු 35ට අඩුවිය යුතුය.

(iv) පහත දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය :—

(අ) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය (ඉංග්‍රීසි මාධ්‍යය).

(ආ) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය—එහෙත් ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව "බී" නිර්දේශයෙන් සාමාර්ථය කවර අවස්ථාවකදී වත් ලබා සිටිය යුතුය.

(ඉ) ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී වාර දෙකකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව ("අ" හෝ "ආ" නිර්දේශය) හා ගණිතය හෝ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් සමත්වීම. එහෙත් ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව "බී" නිර්දේශයෙන් සාමාර්ථය කවර අවස්ථාවකදීවත් ලබා සිටිය යුතුය.

6. **පුරප්පාඩු.**—ඉංග්‍රීසි උපගුරු පුරප්පාඩු ඇත්තේ පහත පෙනෙන දිස්ත්‍රික්කවල පමණකි. මේ දිස්ත්‍රික්ක අතුරෙන් අයදුම්කරුට අභිමත ඕනෑම දිස්ත්‍රික්කයක් සේවය කිරීම පිණිස තෝරාගත හැකිය. එම දිස්ත්‍රික්කය තුළ පදිංචිය හෝ එය සම්බන්ධ අන්‍ය අවශ්‍යතාවක් සපුරාලීමට නැත.

පුරප්පාඩු ඇති දිස්ත්‍රික්ක : මීගමුව, කළුතර, කුරුණෑගල, හලාවත, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාරේ; බදුල්ල, මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුරය, කෑගල්ල, මහනුවර, නුවරඑළිය.

උතුරු පළාතේ ද, අම්පාරේ හැර නැගෙනහිර පලාතේ ද, කොළඹ සහ මාතලේ යන දිස්ත්‍රික්කවලද පුරප්පාඩු නැති බැව් සැළකිය යුතුය.

7. **විභාග මධ්‍යස්ථාන.**—(i) පහත දැක්වෙන මධ්‍යස්ථාන වල විභාගය පැවැත්වේ—

කොළඹ, කළුතර, මීගමුව, කුරුණෑගල, හලාවත, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාරේ, බදුල්ල මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුරය, කෑගල්ල, මහනුවර, මාතලේ, නුවරඑළිය.

(ii) අයදුම්කරුවන් සෑහෙන ගණනක් ඉදිරිපත් නොවන මධ්‍යස්ථාන කපාහැරීමට සිදුවේ. එවැනි මධ්‍යස්ථානවලට ඉල්ලුම් කළ අයදුම්කරුවෝ එයට ඉතා ආසන්න වූ හෝ ඔවුනට පහසුවන අන්‍ය මධ්‍යස්ථානයකට හෝ මාරු කරනු ලැබෙත්.

(iii) ගුරුවරයෙකු වශයෙන් සේවය කිරීමට වඩා කැමති දිස්ත්‍රික්කය හා ඊළඟට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය යන දෙකම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කිරීමට ඇත. එයින් පළමුව සඳහන් කරන ලද දිස්ත්‍රික්කයට අයිති මධ්‍යස්ථානයෙහි හැකිනම් විභාගය ගන්නා මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

(iv) විභාගය ගැනීමට තෝරා ගන්නා ලද මධ්‍යස්ථානය කිසිම හේතුවක් නිසා පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

8. **විභාගය.**—

(i) ඉංග්‍රීසි පැය 2½ යි ... ... ලකුණු 100 යි

ඉංග්‍රීසි භාෂාවේ, හැම අංශයක් පිළිබඳවම අයදුම්කරු ලත් ප්‍රවීණතාව මැනීමට කෙටි පිළිතුරු අවශ්‍ය ප්‍රශ්න රාශියක් පත්‍රයට ඇතුළු වේ. අයදුම්කරුවන් ඉංග්‍රීසි පොත්පත් කියවා ඇතිදැයි ද, පරීක්ෂා කෙරෙනවා ඇත.

(ii) වාචක පරීක්ෂණයක් නොමැතිය.

9. **විභාගයට ඇතුළුකර ගැනීම.**—(i) මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුගෙවා ඉල්ලුම්කරන සියළුම අයදුම්කරුවෝ පරීක්ෂණයට ඇතුළු කරනු ලැබෙත්.

(ii) අයදුම්කරුවෙකු එසේ ඇතුළු කර ගැනීම ඔහුගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන්නේය. අයදුම්කරුවෙකු නුසුදුසු වෙතොත් හෝ අසත්‍ය කරුණු ඉදිරිපත් කළහොත් හෝ දිය යුතු අවශ්‍ය කරුණු නොදී හැරියොත් හෝ විභාගයට පෙර, එය පවත්වන අතර, එයට පසු යන මේ ඕනෑම අවස්ථාවකදී විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

10. **පරීක්ෂණයට ඇතුලුවීමට ඉල්ලීම්**—(i) මෙම නිවේදනයෙහි අග පලවන ආදර්ශ ආකෘතිය අනුව අයදුම් කරු විසින්ම පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් මෙම පරීක්ෂණයට ඇතුළු වීමට ඉල්ලුම් කළ යුතුය.

(ii) අයදුම්පත සකස් කිරීමේදී මෙහි පහත දැක්වෙන උපදෙස් අකුරටම පිළිපැදිය යුතුය. ඒවා නොසළකා හැරීම අයදුම්පත ප්‍රතික්ෂෙප කිරීමට හේතුවේ—

(අ) ෆුල්ස්කැප් ඉරුවක, එනම් 8'' × 13'' ප්‍රමාණයේ කඩදසියක අයදුම්පත පිළියෙල කරනු විනා වෙනත් ප්‍රමාණයේ කඩදසියක් ප්‍රයෝජනයට නොගත යුතුය ;

(ආ) ටයිප්රයිටරයක් මගින් අයදුම්පත් පිළියෙල කළ ද වරදෙක් නැත. අත් අකුරෙන් පිළියෙල කරන්නේ නම් අයදුම්පතෙහි ආකෘතිය රතු තීන්තෙන් විය යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීම නිල් හෝ කලු තීන්තෙන් කළ යුතු ය ;

(ඉ) අයදුම්පත් කොටු ඉරි ඇඳ වෙන් කරන්න. ඒවා නියමිත පිළිවෙලට තිබිය යුතුවාක් මෙන්ම, අයදුම් පතෙහි නියමිත පිටුවෙහි ද විය යුතුය. කොටු වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු එකටෙක ගොඩ නොගැසෙන ලෙසද කොටුවල ලිවීමට අපහසු නොවන ලෙසද ඉතා හොඳ අන්දමින් කොටු සඳහා ඉඩ වෙන් කළ යුතුය.

(iii) අයදුම් පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍ර, සපයන ලද කරුණු අනුව සළකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. විභාගයට පසුව නම් අයදුම්කරු ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(iv) අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 2,400 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු යන මොවුන්ගෙන් කෙනෙකු විසිනි.

(v) **ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1964 ජූලි මස 20 වැනි දින වේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර එදින හෝ එදිනට පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය.** අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම ද, තමන් ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය ද සටහන් කළ යුතුය ;.

(vi) අයදුම්පත්‍ර ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

(vii) කිසියම් ලියවිල්ලක් අයදුම් පත්‍රය සමග නොඑවිය යුතු ය.

11. **විභාග ගාස්තු.**—සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රයට රුපියල් 5ක් වටිනා මුද්දර අලවා ඒ පිට තම අත්සන හා දිනය දැමීමෙන් එය අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නොකර මුද්දර එවීම සම්බන්ධයෙන් කාර්යාලය වග කියන්නේ නැත.

12. **අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.**—(i) පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම් පත්‍ර ප්‍රතික්ෂෙප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. අයදුම්කරු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ—

(ඒ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ අන්කිසි විධියකින් ව්‍යවස්ථානුකුල නොවන අයදුම් පත්‍ර ;

(බී) නියමිත මුද්දර ගාස්තු නැති අයදුම් පත්‍ර ;

(සී) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර.

(ii) අයදුම් පත් ප්‍රතික්ෂෙප කළ විට මුද්දර ගාස්තුව රාජ්‍යසන්තක වනවා ඇත.

13. කවර කරුණක් නිසා වුවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු දෙනු නොලැබේ.

14. **ප්‍රවේශ පත්‍ර.**

(i) විභාගය පැවැත්වීමට දින හතකට පමණ පෙර පුවත්පත් හා ලංකා ගුවන් විදුලි සේවය මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බව දැනුම් දෙනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම් කරුවෙක්ම සැළකිල්ලෙන් සිටිය යුතුය. එය පළවූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

(ii) යම් හෙයකින් අයදුම්කරුවෙකුට විභාගය පටන් ගන්නා දිනට යටත් පිරිසෙයින් දින 7කට කලින් ප්‍රවේශ පත්‍රයක් නොලැබුනහොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය Exams) ඒ බව නොපමාව දන්වා එවිය යුතුය. එසේ දන්වා එවීමේදී පහත සඳහන් විස්තරද සටහන් කළ යුතුය—

(අ) විභාගයේ නම :————

(ආ) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————

(ඇ) සම්පූර්ණ ලිපිනය :————

(ඈ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථාන :————

(උ) අයදුම් පත්‍රය එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල් පොල හා රෙජිස්ටර් අංකය :————

15. **හැඳින්වීමේ පත්‍ර.**—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයයකට පෙනී සිටින විට විභාග ශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ හැඳින්වීමක් කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පහත සඳහන් වන ලියකියවිලි එකක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity card) ;

(ආ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්දවූ ද වලංගුව පවත්නාවූ ද, '' පාස්පෝට් '' (Pass Port) බලපත්‍රයක් ;

(ඇ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලයලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්දවූද, තම ඡායාරූපය දරන්නාවූ ද සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් එහි පිට පැත්තේ පහත දැක්වෙන සහතිකය සැපයිය යුතුය. එම සහතිකය කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින්ය :—

පිටපැත්තේ පෙනෙන ඡායාරූපය ————ගේ බවත්, පහත යොදා ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත් මම සහතික කරමි.

————, ————,

අයදුම්කරුගේ අත්සන. සහතික කරන්නාගේ අත්සන.

————

නම සහ තත්වය.

දිනය :————

ඉහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුගේ විභාග අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි එවැන්නකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

16. **ලියකියවිලි.**—අයදුම් පත්‍රය සමග ලියකියවිලි කිසිවක් දෙපාර්තමේන්තුවට නොඑවිය යුතුයි. සුදුසුකම් තහවුරු කිරීම පිණිස අවශ්‍යවන ලියකියවිලි එනම්, විභාග පිළිබඳ මුල් සහතික හෝ ප්‍රතිඵල ලේඛන හෝ පාසැල් ප්‍රධානයන්ගේ සහතික, සහ රටේ සැලකිය යුතු දෙදෙනකුගෙන් මෑතදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක් පත්වීම් ලැබීමට තේරෙන අයදුම්කරුවන් විසින් පත්වීම් ලැබීමේදී ඉදිරිපත් කළ යුතුයි.

17. මෙම ව්‍යවස්ථාවල ඇතුළුව නැති කරුණක් පිළිබඳව අවසාන තීරණය විභාග කොමසාරිස් විසින් හා/හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ගනු ලැබේ.

එච්. එල්. විමලසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ විභාග දෙපාර්තමේන්තුවේදීය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### සිංහල මාධ්‍ය පාඨශාලාවල ඉංග්‍රීසි උපගුරුවරුන් වශයෙන් සේවය කිරීමට ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය—1964

| | |
|---|---|
| 1. විභාගය ගන්නා මධ්‍යස්ථානය :———— | විභාග අංකය :———— (කාර්‍යාලයීය ප්‍රයෝජනය සඳහා) |

2. සේවය කිරීමට වඩාම කැමති දිස්ත්‍රික්කය :————
දෙවැනි තේරීම :————

| | |
|---|---|
| 3. අගට යෙදෙන නම :———— (මුලකුරු සමග) | 4. පිරිමියෙක් නම් 'පි' ද ගැහැනියෙක් නම් 'ගැ' ද ලොකුවට මේ කොටුවෙහි ලියන්න. |
| 5. මුලකුරුවලින් හැඳින්වෙන නම :———— | |
| 6. ලිපිනය :———— | 7. උපන් දිනය :———— 1964.7.15 දිනට වයස :———— |

8. අධ්‍යාපනික සුදුසුකම (ව්‍යවස්ථා 5 (IV) හි දී ඇති සුදුසුකම් අතුරෙන් ලබා ඇති සුදුසුකම) සම්පූර්ණ විස්තර—විභාග, වර්ෂ මාස වියෂයන් ආදිය :————

9. මෙහි දෙන ලද තොරතුරු සත්‍ය බැව්ද, මෙම විභාග ව්‍යවස්ථාවනට එකඟ බැව් ද සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

10. මුද්දර කොටුව

රු 5ක් වටිනා මුද්දර අලවා අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කරන්න. මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.

11. අයදුම්කරුගේ අනන්‍යතාව : මෙම අයදුම්කරු මා හොඳාකාර අඳුනන බවද, අද දින මා ඉදිරියේ අත්සන් කළ බව ද, සහතික කරමි.

————, ————,
අයදුම්කරුගේ අත්සන. සහතික කරන අයගේ අත්සන.
දිනය :————

සහතික කරන අයගේ නම :————
තත්ත්වය :————
ලිපිනය :————

7-252—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/11 (ජී)

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය —1962 ජූනි

අංක 13,992 හා 1964.3.20 වැනි දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ 1964.3.11 වැනි දින සමාංකය දරන නිවේදනයට වැඩිමනත් වශයෙනි. 1962.6.30 වැනි දින පවත්වන ලද යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂක-අපේක්ෂිකාවන් ද යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරා ගෙන ඇති බැව් මෙයින් දැනුම් දෙමි.

| නම | | ලිපිනය |
|---|---|---|
| කිරිබණ්ඩා, හේ. මු. | ... | කුරුණෑගල, අනුක්කනේ, කුරුහැරගෙදර, විවිධ සේවා සමුපකාර සමිතිය. |
| පේමවතී, ර. (මෙනෙවිය) | ... | බණ්ඩාරගම, අළුත්ගම, ආලෝක පාර. |
| බන්දුසේන, නා. ව. ජා. | ... | බද්දේගම, වැසිහේන, කඩපාලුගොඩවත්ත. |
| විජේවික්‍රම, වෙ. (මෙනෙවිය) | ... | ගෝනාපිනුවල, ගෝනාපිනුවල බටහිර. |
| සිල්වා, පෙ. ජ්‍රේ. | ... | බලපිටිය, තැපැල් කාර්යාලය |
| සුමනාවතී, ව. දේ. (මෙනෙවිය) | ... | අවිස්සාවේල්ල, ආරාධනාකන්ද, අංක 12. |

2. ඉහත සඳහන් 1964.3.11 වැනි දින සමාංකය දරන ගැසට් නිවේදනයේ පළ කළ "ජයසූරිය, ම.තෝ.නි.මේ.ප්‍ර. (මෙනෙවිය)" යන්න "ජයසූරිය, ම.තෝ.නි.මේ.ප්‍ර," ලෙස සංශෝධනය විය යුතු ය.

කීර්ති වීරක්කොඩි,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවට ය.

1964 ජූනි 18 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

7-20—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### නුපුහුණු පළමුවැනි පෙළ සහතික ලත් ගුරුවරුන් සඳහා ගුරු විද්‍යාලයීය ප්‍රවේශ ප්‍රරීක්ෂණය—1964 (සාමාන්‍ය පන්ති සඳහා)

මෙම විභාගයට පෙනී සිටිය හැක්කේ දැනට රජයේ පාසලක හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක සේවයේ යෙදී සිටින ගුරුවරුන්ට පමණි.

1. **විභාගය පවත්වන දිනය.**—1964 සැප්තැම්බර් මස 5 වැනි දින.

2. **විභාග ස්ථාන**—

(i) මේ විභාගය පහත දැක්වෙන මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ. එනම් : කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, මහනුවර, මාතලේ, නුවරඑළිය, හලාවත, ,කුරුණෑගල, යාපනය, වවුනියාව අම්පාරේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව, බණ්ඩාරවෙල, මොණරාගල, කෑගල්ල, රත්නපුරය.

(ii) අයදුම්කරුවන් විසින් තෝරා ගනු ලබන මධ්‍යස්ථාන තමන් පදිංචි ස්ථානයට හෝ සේවය කරන ස්ථානයට හෝ තුදුරින් පිහිටා ඇති මධ්‍යස්ථානම විය යුතුයි. අයදුම්කරුවන් සෑහෙන ගණනක් ඇතුළුවී නැති කවර මධ්‍යස්ථානයක් වුවද අවලංගු කරනු ලැබේ.

(iii) මුලින් තෝරාගත් විභාග මධ්‍යස්ථානය සාමාන්‍යයෙන් වෙනස් නොකරනු ලැබේ. එහෙත් ඈත පාසැලකට මාරු කරනු ලැබීම වැනි විශෙෂ දුෂ්කරතාවන් ඇති වූ අවස්ථාවල ඉදිරිපත් කරන ලද කරුණුවල වැදගත්කම අනුව මධ්‍යස්ථානය වෙනස් කිරීමට ඉඩ දෙනු ලැබේ. එවැනි ඉල්ලීම් කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

(iv) **සැලකිය යුතුය.**—මොනම කරුණක් නිසාවත් මෙම දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුවකුට නියම කරන ලද විභාග ශාලාව හැර අන් විභාග ශාලාවක විභාගයකට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එනම් 10 වන ව්‍යවස්ථාව අනුව ප්‍රවේශ පත්‍රයක් ලද අයදුම්කරුවකුට අන්‍ය විභාග ශාලාවක "විරෝධතාවෙන්" විභාගය ගත නොහැකිය.

3. **සුදුසුකම්**—

සැම අයදුම්කරුවකුටම පහත සඳහන් සුදුසුකම් ඇතිවිය යුතුය :—

(i) චරිතය යහපත් විය යුතුය.

(ii) ලාංකිකයකු විය යුතුය.

(iii) අයදුම්කරුවන් පුහුණු පළමුවැනි පෙළ සිංහල ගුරු සහතික පත්‍රය ලබා සිටි යා යුතුය. 1964 ජූලි මස 17 වැනි දින හෝ එදිනට පෙර පළමුවැනි පෙළ ගුරු සහතිකය ලැබීමට හිමිකම් ඇති අයට ද ඉල්ලුම් කළ හැකිය. එසේ වුවද 1964.11.30 දිනට පෙර ඔවුන්ගේ සහතික පත්‍ර පළමුවැනි පෙළට උසස් කරවා ගත යුතුය.

(iv) අයදුම්කරුවන් 1965 ජනවාරි 1 වැනි දිනට, වයස අවුරුදු 46ට නොවැඩි විය යුතු ය.

**4. විභාග පරිපාටිය—**

(i) ලේඛ්‍ය හා සම්මුඛ පරීක්ෂණය වශයෙන් මෙම පරීක්ෂණය කොටස් දෙකකින් යුක්ත වේ. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව තෝරා ගත් අය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබෙත්.

(ii) ලේඛ්‍ය පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් යුක්තය.
සිංහල භාෂාව (පැ. 3) ලකුණු 150 යි.
අංක ගණිතය (පැ. 1½) ලකුණු 100 යි.

(iii) ලේඛ්‍ය පරීක්ෂණයේ කාල සටහන මෙසේය. ප්‍රවේශ පත්‍රය සමග වෙනම කාල සටහනක් නිකුත් කරනු නො ලැබේ.
පෙ.ව. 8.30 සිට පෙ.ව. 11.30 දක්වා—සිංහල භාෂාව
ප.ව. 1.30 සිට ප.ව. 3.00 දක්වා—අංක ගණිතය

(iv) සිංහල භාෂාව, අංක ගණිතය පිළිබඳ නිර්දේශයන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය මෙනි. එහෙත් ඊට වඩා උසස් තත්වයක ප්‍රශ්න පත්‍ර දෙනු ලැබේ. එහෙත් මේ ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලබන පිළිවෙළ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාග යේදී දෙන ප්‍රශ්න පත්‍රවල පිළිවෙලට වඩා වෙනස් වන්නේ ය.

**5. විභාගයට ඇතුළු කර ගැනීම.—**

(i) මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් කරන සියලුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයට ඇතුළු කරනු ලැබෙත්.

(ii) අයදුම්කරුවකු එසේ ඇතුළු කිරීම ඔහුගේ සුදුසුකම් පිළිගැනීමක් නො වන්නේ ය. විභාගයට පෙර හෝ, එය පවත්වන අතර හෝ ඉන් පසු හෝ සම්මුඛ පරීක්ෂණයෙහි දී හෝ ගුරු විද්‍යාලයකට ඇතුළු වී පුහුණුව ලබමින් සිටියදී හෝ පුහුණුව ලැබුවායින් පසු හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අයදුම්කරුවකු විසින් ලබාගත් පුහුණු ගුරු සහතිකය ද අවලංගු කරනු ඇත. වංචනික ලෙස ක්‍රියා කොට ඇති අයදුම්කරුවන්ට ජීවිතාන්තය දක්වා ගුරු වෘත්තියට ප්‍රවිෂ්ට වීමට අවකාශ දෙන කිසියම් විභාගයකට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

**6. පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලීම—**

(i) මෙම නිවේදනයෙහි අග පලවන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරු විසින්ම පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් මෙම පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලුම් කළ යුතුය. මුද්‍රිත අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු නොලැබේ.

(ii) අයදුම්පත සකස් කිරීමේදී මෙහි පහත දැක්වෙන උපදෙස් අකුරටම පිළිපැදිය යුතුය. ඒවා නොසළකා හැරීම අයදුම්පත ප්‍රතික්ෂෙප කිරීමට හේතු වේ :—

(අ) ෆුල්ස්කැප් ඉරුවක, එනම් 8"×13" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත පිළියෙල කරනු විනා වෙනත් ප්‍රමාණයේ කඩදාසියක් ප්‍රයෝජනයට නොගත යුතුය.

(ආ) ටයිප්රයිටරයක් මගින් අයදුම්පත පිළියෙල කළද වරදෙක් නැත. අත් අකුරෙන් පිළියෙල කරන්නේ නම් අයදුම් පතෙහි ආකෘතිය රතු තීන්තෙන් විය යුතුය. අයදුම් පත සම්පූර්ණ කිරීම නිල් හෝ කලු තීන්තෙන් කළ යුතුය.

(ඉ) අයදුම්පතේ කොටු ඉරි ඇඳ වෙන් කරන්න. ඒවා නියමිත පිළිවෙලට තිබිය යුතුවාක් මෙන්ම අයදුම්පතෙහි නියමිත පිටුවෙහි ද විය යුතුය. කොටු වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු එකටෙක ගොඩ නොගැසෙන ලෙසද කොටුවල ලිවීමට අපහසු නොවන ලෙසද ඉතා හොඳ අන්ද මින් කොටු සඳහා ඉඩ වෙන් කළ යුතුය.

(iii) අයදුම්පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිවද නිවැරදිවද සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම්පත්‍ර, සපයන ලද කරුණු අනුව සලකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂෙප කිරීම හෝ විභාගයට පසුව නම් අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වයද අවලංගු කරනු ලැබේ. පහත සඳහන් කරුණු වලට අයදුම්කරුවන්ගේ සැලකිල්ල යොමු විය යුතුය :—

(ඒ) ලියාපදිංචිකරන ලද ගුරුවරුන් හා ගුරුවරියන් විසින් අයදුම් පත්‍රවල භාවිත කළ යුත්තේ ලියාපදිංචි කිරීමේ දී යොදන ලද නම් ය.

(බී) අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස්කෙනකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 2,400 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු යන මොවුන්ගෙන් කෙනකු විසිනි.

(සී) සියලුම ගුරුවරුන් ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ පාසැල් ප්‍රධානයන් මගිනි.

(iv) **ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය.—**1964.7.17
සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදින හෝ එදිනට පෙර කොළඹ 2, මැලේ වීදියේ 'ගුරු විද්‍යාල ශාඛාවේ', අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ විභාගයේ නම ද, තමන් ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානයද සටහන් කළ යුතුය.

(v) අයදුම්පත්‍ර ලැබුන බව දන්වා එවනු නොලැබේ.

(vi) කිසියම් ලියවිල්ලක් අයදුම් පත්‍රය සමග නොඑවිය යුතුය.

**7. විභාග ගාස්තු.—**

සෑම අයදුම්කරුවකු ම තම අයදුම්පත්‍රයට රු. 10ක් වටිනා මුද්දර අලවා තම අත්සන හා දිනය යෙදීමෙන් එය අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නො කළ මුද්දර එවීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වග කියන්නේ නැත.

**8. අයදුම්පත් ප්‍රතික්ෂෙප කිරීම.—**

(i) පහත දක්වන පරිදි එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂෙප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. යම් හෙයකින් එවැනි අයදුම් පතක් එවන ලද අයදුම්කරුවකු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ :—

(අ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත, හෝ අන් කිසි විධියකින් ව්‍යවස්ථානු කූල නො වන අයදුම්පත්,

(ආ) නියමිත මුද්දර ගාස්තු නැති අයදුම්පත්,

(ඉ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්,

(ii) අයදුම්පත් ප්‍රතික්ෂෙප කළ විට මුද්දර ගාස්තුව රාජ්‍ය සන්තක වෙනවා ඇත.

**9. පරීක්ෂණයට පෙනී නො සිටීම හෝ අයදුම් පත අස්කර ගැනීම සහ මුදල් ආපසු ගැනීම :—**

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර තම අයදුම්පත අස්කර ගැනීම සම්බන්ධව කරන දැන්වීම දෙපාර්තමේන්තුවට ලැබුණහොත් විභාග ගාස්තුවෙන් 90%ක් ආපසු ගෙවනු ලැබේ.

(ii) මොනයම් කාරණයක් සඳහා හෝ පරීක්ෂණයට නොපැමිණීම ඇතුළු ව අන් සියලුම අවස්ථාවන්හිදී විභාග ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවීම සඳහා අනුමතියක් නොලැබේ. ගෙවන ලද මුදල් ඉදිරි වර්ෂයක විභාගය සඳහා ගෙනයෑමට ද ඉඩ දෙනු නො ලැබේ.

(iii) එහෙත් අයදුම්කරුවකුගේ මරණය නිසා හෝ බරපතල කල්ගිය රෝගයකින් (උදා : ක්ෂය රෝගය, අංශබාගය, මානසික හෝ නහරගත ආබාධයන්) පෙළෙමින් සිටීම නිසා හෝ විභාග ගාස්තුවෙන් 90%ක් ආපසු ගෙවනු ලැබේ. මෙසේ ගෙවනු ලබන්නේ විභාගයෙහි එක් ප්‍රශ්න පත්‍රයකටවත් පෙනී නොසිටියහොත් පමණකි. මෙම ව්‍යවස්ථාව අනුව මුදල් ආපසු ඉල්ලා එවීම හැකි පමණ කල් ඇතිව කළ යුතු ය.

**10. ප්‍රවේශ පත්‍ර.—**

(අ) විභාගය පැවැත්වීමට දින 7කට පමණ පෙර පුවත් පත් හා ලංකා ගුවන්විදුලිය මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බව සඳහන් දැන්වීමක් කරනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම්කරුවකුම සැළකිල්ලෙන් සිටිය යුතුය. එය පළවූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

(ආ) යම් හෙයකින් අයදුම්කරුවකුට ප්‍රවේශ පත්‍රයක් නොලැබුණ හොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ගුරු විද්‍යාල ශාඛාවේ අධ්‍යක්ෂ වෙත, ප්‍රවේශ පත්‍රය නොලැබුණු බව නොපමාව දන්වා එවිය යුතුයි. විදුලි පුවතකින් මෙසේ දැන්වීම වඩා හොඳ ය. හැකිනම් පැමිණ විමසන්න. ඒ සෑම විටකම පහත සඳහන් විස්තර සැපයිය යුතුය, එනම් —

(i) විභාගයේ නම :————,

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————,

(iii) සම්පූර්ණ ලිපිනය :————,

(iv) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය :————,

(v) අයදුම් පත්‍රය එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල් පළ හා රෙජිස්ටර් අංකය :————,

**11. හැඳින්වීමේ පත්‍ර.—**

(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයයට පෙනී සිටින විට විභාගශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ හැඳින්වීමක් කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පහත සඳහන්වන ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් තුමා විසින් නිකුත්කරන ලද වලංගුව පවතින හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity Card),

(ආ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්දාවූද වලංගුව පවත්නාවූ ද, "පාස්පෝර්ට්" (Passport) බල පත්‍රයක්,

(ඉ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්දාවූ ද තම ඡායාරූපය දරන්නාවූ ද සහතිකපත්‍රයක් හෝ බල පත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්.

(ඊ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක්. මෙම ඡායාරූප පිටපත විභාගශාලාධිපති වෙත රඳවාගනු ඇත.

පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති

පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති———————————— යන අයගේ (අයදුම්කරුගේ සම්පූර්ණ නම)
බව මම සහතික කරමි.

————,
අයදුම්කරුගේ පුරුදු අත්සන.

————,
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

————,
(නම සහ තරාතිරම)

දිනය :————.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නො හැකි ඉල්ලුම්කරුවකුගේ අපේක්ෂකත්වය තාවකාලිකය. එම අපේක්ෂකත්වය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

**12. ලිපි ලේඛනාදිය.—**

(i) පහත දක්වන ලිපි ලේඛන සියල්ලම හෝ ඉන් සමහරක් උවමනා වන්නේ ය :—

(අ) ලංකාවේ පුරවැසියකු හැටියට ලියාපදිංචි කළ සහතිකය හෝ (අදාළ නම්) පුරවැසි භාවය ලැබීමට ඇති සුදුසුකම් පිළිගත් බවට නිකුත් කෙරෙන රාජකාරි ලියමනෙහි මුල් පිටපත.

(ආ) උප්පැන්න සහතික පත්‍රය හෝ වයස සම්බන්ධ විශෙෂ සහතිකය. (පාසැල්වලට ඇතුළුවීම සඳහා නිකුත් කරන විශෙෂ උප්පැන්න සහතිකය හෝ බෞතීස්ම සහතිකය බාරගනු නොලැබේ. උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් සහතික බාරගනු නො ලැබේ)

(ඉ) දිවුරුම් සහතික. (උවමනා විටක නමෙහි ඇති වෙනස්කම් සඳහා මෙය ඉදිරිපත් කළ යුතුය.) මෙම දිවුරුම් සහතික දිවුරා අත්සන් කළ යුත්තේ තම දෙමාපියන් විසින් හෝ ඔවුන් ජීවතුන් අතර නැත්නම් වයස අවුරුදු 21 ට වැඩි කිට්ටු ඥාතිවරයකු විසින් ය. උප්පැන්න සහතික පත්‍රයෙහි නම් වෙනස් කිරීමට කටයුතු කරගෙන යනු ඇතැයි එම දිවුරුම් සහතිකයෙහි සඳහන් කළ යුතුය. දිවුරුම් සහතිකය පිළියෙල කිරීම සඳහා මුද්දර වුවමනා නැත.

(ඊ) අයදුම්කරු විසින් ව්‍යවස්ථා අනුව මෙම විභාගයට සුදුසුකම් පිළිබඳව කළ සෑම ඉල්ලීමක්ම නිවැරදි බැව් විදුහල්පති සහතික කළ යුතුයි. අයදුම්කරු පාසලට පත්වූ දින හා ඔහු දරන තනතුර, පාසලේ නම සහ ලිපිනය ද සඳහන් වී තිබිය යුතුය.

(උ) සැළකිය යුතු ප්‍රභූවරුන් දෙදෙනකුගෙන් අයදුම්කරුගේ චරිතය පිළිබඳ සහතික. එම සහතික අවුරුදු 5කට වඩා කාලයක් අයදුම්කරු හොඳින් දන්නා අඳුනන අයකුගෙන් මෑත කාලයකදී ගන්නා ලද්දක් විය යුතුයි. පිළිගත හැකි ඉතාම හොඳ සහතික නම් තම පාසලේ විදුහල්පතිගෙන් හෝ අයදුම්කරු පදිංචි නගරයෙහි හෝ ගමෙහි සිටින නිලධාරියෙකුගෙන් ය.

(ii) **ලියකියවිලි :** සහතික හෝ ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිවක් අයදුම් පත්‍රය සමග නො එවිය යුතුය. අවශ්‍ය සහතික පත්‍ර, ලියකියවිලි ආදී සියල්ලක් ම ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් විසින් පමණක් එම පරීක්ෂණයෙහිදීය.

(iii) සුදුසුකම් තහවුරු කිරීමට අවශ්‍යවූ ද පිළිගත හැකිවූ ද ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්පත්‍රය සමග යම් ලියකියමනක් එවනු ලැබුවොත් එය පිළිබඳ මෙම දෙපාර්තමේන්තුව වග නො කියයි.

(iv) මෙම ලිපි ලේඛනාදියෙහි සත්‍යතාව සම්බන්ධයෙන් අයදුම්කරු සම්පූර්ණයෙන් වග කිය යුතුය. නුසුදුසු ලෙස වෙනස් කරන ලද හෝ අත්සන් වෙනස් කරන ලද හෝ අසත්‍ය දෙය ප්‍රකාශ කරන ලද ලිපි ලේඛනාදිය හෝ ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට තදබල දඬුවම් පමුණුවනු ලැබේ. ඔවුන්ට පරීක්ෂණයට පෙනී සිටීමට ඇති සුදුසුකම අවලංගු වීම සහ ගුරු වෘත්තිය සඳහා පැවැත්වෙන සියලුම පරීක්ෂනයන්ට මුළු ජීවිත කාලය තුළදීම පෙනී සිටීමට නොහැකිවීම ද සිදුවේ. ඔවුන් වෙනුවෙන් සහතික පත්‍ර නිකුත් වී තිබේ නම් ඒවා ආපසු ලබා අවලංගු කරනවා ඇත.

**13. ප්‍රතිඵල.—**

මේ පරීක්ෂණයේ (ලේඛ්‍ය හා සම්මුඛ යන කොටස් දෙකේම) ප්‍රතිඵල අනුව පුහුණුවීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට පෞද්ගලික වශයෙන් දැනුම් දෙනු ඇත. කායික හෝ මානසික ආබාධයන්ගෙන් පෙළෙන අයදුම්කරුවන් තෝරාගනු ලැබීමට නුසුදුස්සන් වෙනවා ඇත. ප්‍රතිඵල ලේඛනයක් ප්‍රසිද්ධ කරනු නො ලැබේ. විස්තර ප්‍රතිඵල ද නිකුත් කරනු නොලැබේ. මේ විභාගයේ ප්‍රතිඵල ගැන ලියනු ලබන ලියුම් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ (ටීසී) "ගුරු විද්‍යාල පිළිබඳ ශාඛාව" වෙත යැවිය යුතුය.

**14. ව්‍යවස්ථාවන් වෙනස් කිරීම්.—**

විභාගය පිළිබඳ ව්‍යවස්ථා විශාලව වෙනස් කළ විට ඒ බව ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් දැනුම් දෙනු ලැබේ. එවැනි වෙනස් කිරීම් ශුද්ධි පත්‍රයක් වශයෙන් හෝ ඒවා ඇතුළු කිරීමෙන් සංශෝධනය කළ අළුත් ව්‍යවස්ථා මාලාවක් වශයෙන් හෝ නිකුත් කරනු ලැබේ.

**15. වෙනත් කරුණු.—**

මේ ව්‍යවස්ථාවන්හි සඳහන් නොවූ යම්කිසි කරුණක් පිළිබඳ තීරණය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කරනු ලැබේ.

## පරිශිෂ්ටය

**1. අභ්‍යාස පංක්ති පුහුණුව.—**

(i) පුහුණුවීමේ කාලය අවුරුදු එකකි. පුහුණුවීමේ කාලය තුළ දී තමන්ගේ ගති පැවතුම් පිළිබඳ හෝ අධ්‍යයන කෞශල්‍යය පිළිබඳ හෝ ගුරු විද්‍යාලයේ ප්‍රධානයා තෘප්තිමත් නො කරන ශිෂ්‍යයෝ පුහුණුවීමෙන් අස්කරනු ලැබෙත්. මේ සම්බන්ධයෙන් අවසාන තීරණය අධ්‍යාපන අධ්‍යක්ෂ සතු ය.

(ii) මේ පුහුණු පාඨමාලාව සතුටුදායක අන්දමින් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට පුහුණු දෙවැනි පෙළ ගුරු සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ. මේ දෙවැනි පෙළ සහතික පත්‍රය අවුරුදු 3 ක සතුටුදායක ගුරු සේවයකින් පසුව පළමුවැනි පෙළට උසස් කරනු ලැබේ.

**2. ඇතුළ කර ගැනීම.—**

(i) සෑම අයදුම්කරුවකු විසින් සම්පූර්ණ කරන ලද ඇප ඔප්පුවක් සමග ඊට අදාල සියළු ලියකියවිලි විද්‍යාලයාධිපතිට ගුරු විද්‍යාලයට ඇතුළු වන දිනම ඉදිරිපත් කළ යුතුය. පහත දැක්වෙන කරුණු පිළිබඳ අයදුම්කරු ඇපවිය යුතුය :—

(අ) පුහුණුව අවසන් වනතුරු දේශපාලනමය වැඩෙහි නොයෙදීමට,

(ආ) පුහුණුව අවසාන වනතෙක් එය අත් නොහැරීමට,

(ඉ) පුහුණුව අවසන් වීමට පසු අඛණ්ඩව අවුරුදු 8ක් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කරනු ලැබූ විට ගුරු සේවයෙහි යෙදීමට,

(ඊ) ඉහත සඳහන් සේවා කාලය සම්පූර්ණ කෙරෙන තුරු ද ඇප ඔප්පුවේ සඳහන් කොන්දේසි සියල්ලක් ම සම්පූර්ණ කරන තුරු ද වෙනයම් තනතුරක් සඳහා හෝ නැවත අධ්‍යයන තිවාඩු සඳහා හෝ නො ඉල්ලීමට,

(උ) පුහුණුව ලබන කාලය තුළ දී හෝ පුහුණුවෙන් පසු අවශ්‍යයෙන් ම ගුරු සේවය කළ යුතුව ඇති අවුරුදු 8 තුළ දී හෝ මුදල් ගෙවා ඇප ඔප්පුවෙන් නිදහස් විය හැක්කේ ගුරු සේවයෙන් සම්පූර්ණයෙන් අස්වන අයට පමණකි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 ජූනි මස 29 වැනි දින,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ, 2.

## ආදර්ශ අයදුම් පත්‍ර

**ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නුපුහුණු පළමුවැනි පෙළ සහතික ලත් ගුරුවරුන් සඳහා ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය—1964**

විභාග අංකය :..............

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. නම (මුලකුරු සමග) :————.

2. (ඒ) සියලුම නම් සම්පූර්ණයෙන් :————.
   (බී) ජාතිය :————.

3. ලිපිනය :————

4. තෝරාගත් මධ්‍යස්ථානය :—
   පළමුවැනි තේරීම :————.
   දෙවැනි තේරීම :————.

5. පිරිමියෙක් නම් "පි" ද ගැහැණියෙක් නම් "ගැ" ද ලොකු අකුරින් ලියන්න :————.

6. (i) ගුරු සහතික පත්‍රයේ අංකය :————.
(ii) පළමුවැනි පෙළට උසස් කළ දිනය :————.
(iii) ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචිකිරීමේ අංකය :————.

7. (i) මෙම පරීක්ෂණය පිළිබඳ නිවේදනය අනුව මට පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවද ;
(ii) මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන ලද තොරතුරු මා දන්නා පමණින් හා විශ්වාසය අනුව සැබෑ බව ද ;
(iii) මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකළ වලංගු මුද්දර බවද මම සහතික කරමි. තවද, මෙම පරීක්ෂණය පිළිබඳ ව්‍යවස්ථාවනට සහ අයදුම්කරුවන් සඳහා පනවා ඇති නියෝගයනට එකඟව ඒවායින් බැඳී සිටීමටද පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8. මුද්දර කොටුව :————.

සැළකිය යුතුයි.—රුපියල් 10ක් වටිනා මුද්දර මෙහි අලවා අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කරන්න. මුද්දර එකපිට එක ඇලවීම නොකළ යුතුය. (පහත සඳහන් 9 වෙනි කොටුව අයදුම් පත සකස් කරන කඩදාසියේ පසුපිට විය යුතුය).

9. අයදුම්කරුගේ අනන්‍යතාව සහතික කිරීම :

මෙම අයදුම්පතෙහි නම් සඳහන් වන අය මා හොඳාකාර අඳුනන බව ද, අද දින මා ඉදිරියෙහි දී අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ නම (පැහැදිලිව) :————.

තත්වය :————.

ලිපිනය :————.

7–217—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහිවූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| ගුදිරි කොහු කෙඳි සහ බ්‍රිස්ටල් කොහු කෙඳි සැපයීම (1964.10.1 සිට—1965.9.30 දක්වා) ... | 1964.7.28 |
| මෙරට සෑදූ විෂබීජ නාශක ද්‍රව සැපයීම (1964.10.1 සිට 1965.9.30 දක්වා) ... | 1964.8.4 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිට පතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1964 ජූලි 3 වැනි දින,
කොළඹ දීය.

7–248—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ.පෙ. 500, කොළඹ 1), බිත්ති ඔරලෝසු සැපයීම සඳහා 1964.8.18 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964 අගෝස්තු 17 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1964 ජූලි 3 වැනි දින,
කොළඹ දීය.

7-249—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## වැලිකඩ බන්ධනාගාරයේ මෝටර් වැඩපල් ගබඩාවේ ඇති ගෙවී ගිය මෝටර් රථ කොටස් මිලයට ගැනීම

වැලිකඩ බන්ධනාගාරයේ මෝටර් වැඩපල් ගබඩාවේ ඇති විවිධ වර්ගයේ මෝටර් රථවල ගෙවී ගිය කොටස් මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1964 ජූලි 31 වැනිදා පෙරවරු 10.30 දක්වා බාරගනු ලැබේ. නොයෙක් වර්ගවලට අයත් 500 කට අධික මේ කොටස් ඉරිදා හා සෙනසුරාදා යන දිනයන්හිදී හැර සතියේ අනික් දිනවලදී පෙරවරු 9 සිට දවල් 12 දක්වාත් පස්වරු 1 සිට 4 දක්වාත් මෝටර් වැඩපල් ගබඩාවේදී පරීක්ෂා කළ හැක.

2. ටෙන්ඩර් පෝරම සඳහා කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයෙහි රුපියල් 10 ක් තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන ලද රිසිට් පත ටෙන්ඩර් පතට ඇමිණිය යුතුයි. යම් ටෙන්ඩරයක් බාරගත් බව ලිපියකින් දන්වා දින දහයක් (10) ඇතුළතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වී නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්යය පැහැර හැරියේ නම් හෝ ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල රාජසන්තක කරනු ලැබේ. තවද ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හරිනු ලබන කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවෙත දන්වා යවනු ඇත. ටෙන්ඩර් පත පිළිගත් බව දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැව්නි නම් හෝ එම ස්ථානයෙහි තබා ආවේ නම් හෝ ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුනු සේ සලකා ගනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමෙන් පසුව තැන්පත් මුදල් ආපසු දෙනු ඇත.

3. ටෙන්ඩර්කරුවන් විසින් දෙන්නට කැමති මිල ගණන සම්පූර්ණ ගෙවීගිය කොටස් තොගය සඳහාම වශයෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත ලියුම් කවරයක බහා, වසා මුද්‍රා තබා පහත සඳහන් අයගේ ලිපිනයට ඉදිරිපත් කළ යුත්තේ ය. හැම කවරයකම වම්පස

ඉහලම කොනේ "ගෙවී ගිය මෝටර් රථ කොටස් මිලයට ගැනීම සඳහා වූ ටෙන්ඩර්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සඳහා මුද්‍රිත පෝරම නිකුත් කරනු නො ලැබේ.

4. කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර කර්මාන්ත අධිකාරිගේ කාර්‍යාලයේ දී 1964 ජූලි 31 වෙනිදා පෙරවරු 10.35ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ කරුණ පිළිබඳ අනික් අවැසි විස්තර පහත අත්සන් කරන අයගෙන් ලබා ගැනීමට පිළිවන.

පො. කුමාරස්වාමි,
වැ. බන්ධ/කර්මාන්ත අධිකාරී.

1964 ජූනි මස 27 වැනිදා,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

7-218—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1964-65 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ආයතනවලට කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (" ලාංකික " යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙක් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| කොළඹ අළුත්කඩේ බන්ධනාගාර ... | 50 0... | 500 0... | 30. 7.64 |
| තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය, මීගමුව ... ... | 50 0... | 750 0 | 4. 8. 64 |
| තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය, වතුපිටිවෙල ... | 50 0... | 750 0 | 4. 8. 64 |
| එළිමහන් සිර කඳවුර, කුණ්ඩසාලේ ... | 50 0... | 500 0 | 7. 8. 64 |
| බදුල්ල බන්ධනාගාරය ... | 50 0... | 500 0 | 7. 8. 64 |
| මඩකලපුව බන්ධනාගාරය ... | 50 0... | 500 0 | 11. 8. 64 |
| අනුරාධපුර බන්ධනාගාරය ... | 50 0... | 500 0 | 11. 8. 64 |
| ගාල්ල බන්ධනාගාරය ... | 50 0... | 500 0 | 14. 8. 64 |
| මාතර බන්ධනාගාරය ... | 50 0... | 500 0 | 14. 8. 64 |
| තංගල්ල බන්ධනාගාරය ... | 50 0... | 500 0 | 14. 8. 64 |

2. ආහාර සඳහා ගණන් ඉදිරිපත් කිරීමේ දී බත්, පාන්, තේ සහ සීනි යන ද්‍රව්‍යයන් ඇතුළත් නො කොට ගණන් ඉදිරිපත් කළ යුතු බව හා (සියළුම ආයතනයන් සම්බන්ධයෙන් බත්, පාන්, තේ සහ සීනි ආදී ද්‍රව්‍යයන් අත් හැරීමෙන් ආහාර මිශ්‍රණයේ වෙනස් කම් ඇති කර ඇති බවද) අනුරාධපුරය සම්බන්ධයෙන් එළවළු ද අත්හැරිය යුතු බව ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් දැනගත යුතුව ඇත.

3. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා " සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, අධිකරණ අමාත්‍යාංශය " කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ ගණකාධිකාරී, ඊ. එල්. ඩබ්ලිව්. දහනායක මහතාට භාර දී එය ලැබුනු බවට ලිය විල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "........................න ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය " කියා ලියා මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.30ට ප්‍රථම අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට ලැබෙන සේ එවිය යුතුයි. මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්‍යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්‍යාලයෙන් ලබාගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නො ලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර් කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතු යි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් හා මැකීම් වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ හෝ කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැළකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජ සන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සමබන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නො හැකි වන සේ ඔහු ගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත් කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන් රු. 3,000 රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම කොන්ත්‍රාත්කරුවන්ට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ නො එසේව එහි ගෙන ගොස් භාර දුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛන සඳහා තැන්පත් කරනු ලබන මුදල් වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරනු ලබන ගණන් ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැළකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන්, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට, ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට අවශ්‍ය තරම් ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කිරීමට අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරය. ඒ ඒ බන්ධනාගාර අධිකාරි තැනගෙන් කොන්ත්‍රාත්තුව හරියාකාර කිරීමට වුවමනා කරන සියලු තොරතුරු දැනගත හැකිය.

13. ඒ ඒ ටෙන්ඩරය සඳහා වන සියලු කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නො ලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නො මැතිව, කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකකුවෙත පැවරීම හෝ බදු වශයෙන් දීම හෝ කළ නො හැක. කොන්ත්‍රාත්කරුවෙකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ බලය යම් පුද්ගලයෙකු වෙත පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු ඇති නම් කිසියම් පුද්ගලයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවීම ගැන තම විරුද්ධත්වය ලියා දැනුම් දිය හැක. එවැනි කිසිම පුද්ගලයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නො යෙදිය යුතුයි. කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථමයෙන් රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තමාගේ සම්පූර්ණ නම ස්ථිර ලිපිනය, තමන්ට අයිති දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද, වාර්තාවක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් හා දේපොළවල ප්‍රමාණය හා වටිනාකම එහි සඳහන් කළ යුතුයි.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එසේ සේවය ඉටු කරන ලද්දේ දැනට ටෙන්ඩර් කැඳවන දිස්ත්‍රික්කයේ හෝ කොට්ඨාශයේ හෝ සඳහා නොවේ නම්, තමන් විසින් එසේ කොන්ත්‍රාත්තුව ඉටු කරන ලද පළාත් හෝ දිස්ත්‍රික්ක සඳහන් කළ යුතුයි.

(ඇ) වෙන දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත්තුව ඉටු කරන ලද ටෙන්ඩර් කරුවන්, එම දෙපාර්තමේන්තුවේ නම සහ තමා සේවය කළේ කුමන දිස්ත්‍රික්කයේ ද, යන වග සඳහන් කළ යුතුයි.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකු ගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නාවූ නිලධාරියාද, ඔහුට පසුව එම පදවිය දරන්නාවූ නිලධාරියාද වේ.

19. මේ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථානයෙන් ලබා ගත හැක.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1964.6.26. වැනි දින,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

7–102—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

යුද් හමුදාවට විත් මාළු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවූ 1964 ජූනි 12 දින අංක 14,058 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි සඳහන් ටෙන්ඩර් පත් විවෘත කරන දිනය 27.7.64 දින උදය 9.30 දක්වා දීර්ඝ කර ඇත. එසේ හෙයින්, මේ සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1964.7.24 දින දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

ජී. ආර්. ජයසිංහ,
මේජර් ජනරාල්,
යුද්ධ හමුදා ආඥපති වෙනුවට.

යුද හමුදා මූලස්ථානය,
පනළු වැව පාර, තැ. පෙ. 553,
කොළඹ—1964 ජූනි 24 දින.

7–76—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### එලිසබෙත් රැජින වේදිකාවේ පිහිටි අංක 3 දරන ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1964.7.17 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්ම්වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1964.7.10 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

7–236—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### එලිසබෙත් රැජින වේදිකාවේ පිහිටි අංක 2 දරන ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1964.7.17 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්ම්වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1964.7.10 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

7–235—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### විජය කුමාර වේදිකාවේ පිහිටි ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1964.7.17 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්ම්වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1964.7.10 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

7–233—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වෙන්කලාඩි උප කොට්ඨාශය

ආනසුට්ටි කට්ටි කුලම යටතේ ඇති අංක 1 සිට 10 දක්වා වූ වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා ටෙන්ඩර් පත් 1964 ජූලි මස 21 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 42,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 ජූලි මස 17 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී වෙන්කලාඩි වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම වල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, මවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

සු. රාවෙන්ද්‍රම්,
වාරිමාර්ග ඉංජිනේරු,
වෙන්කලාඩි උප කොට්ඨාශය.

වෙන්කලාඩි දී ය.
1964.6. 15 වැනි දින.

7-5—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රත්නපුර උප කොටස

සබරගමු පලාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර උප කොටසේ දොරවෙල්දොල අමුණ ව්‍යාපාරයේ වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1964 ජූලි මස 28 වන අඟහරුවාදා පෙ. ව. 11 දක්වා කොළඹ—8, කෝට්ටෙ පාරේ බටහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 19,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට හෝ සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964.7.6 දින සිට 1964.7.27 දින දක්වා (දෙදිනම ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී රත්නපුර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට පෙර රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම්, සැලසුම් සහ විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී ඉහතකී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

කේ. කනගරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු,
රත්නපුර උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
හිදැල්ලන, රත්නපුර,
1964 ජූනි මස 18 වන දින දීය.

7-60—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රත්නපුර උප කොටස

සබරගමු පලාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර උප කොටසේ උග්ගල්කල්තොට වම් ඉවුර ව්‍යාපාරයේ ප්‍රධාන ඇලේ සහ බෙදුම් ඇල අංක 1, 2 හා 3 පාරවල බොරළු ඇතිරීම සඳහා 1964 ජූලි මස 28 වන අඟහරුවාදා පෙරවරු 11 දක්වා කොළඹ—8, කෝට්ටෙ පාරේ බටහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 16,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට හා සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964.7.6 දින සිට 1964.7.27 දින දක්වා (දෙදිනම ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී රත්නපුර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට පෙර රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම්, සැලසුම් සහ විශේෂ විස්තර යනාදී සියළු දේ කාර්යාල වේලාවන් තුළදී ඉහතකී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

කේ. කනගරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු,
රත්නපුර උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
හිදැල්ලන, රත්නපුර,
1964 ජූනි මස 18 වන දින දීය.

4-61—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මාතලේ උප කොට්ඨාශය

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 ජූලි මස 29 වෙනි දින බදාදා පෙරවරු 10 දක්වා මහනුවර, මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලෙහිම එහිදී සිදු කෙරේ :—

1. අලකොළ කෙපියාවෙල තැන්න අමුණ ඉදිකිරීම ... රු. 31,000
2. නවනෙලිය අමුණ ව්‍යාපාරය ඉදිකිරීම ... රු. 22,000

ඉහත සඳහන් වැඩය සම්බන්ධයෙන් ඉදිරියෙන් සඳහන් මුදලට හෝ ඉන් වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට සුදුසු වෙති.

1964 ජූලි මස 24 වැනි සිකුරාදා තෙක් (එදිනත් ඇතුළුව) කාර්යාල වේලාවන් තුලදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාල යෙන් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් අංක 1 වෙනුවෙන් එකක් රු. 50 බැගින් තැන්පත් මුදලක් ද, අනිත් අංක 2 කේ වැඩය සඳහා රුපි. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ද, ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත.

සිමෙන්ති, හියුම් පයිප්ප සහ කර වළලු දෙපාර්තමේන්තුවෙන් සපයන අතර, පළමුවැනි වැඩය සඳහා පල්ලේගම ගබඩාවෙන් ද, දෙවන වැඩය සඳහා කෝන්ගහවෙල ගබඩාවෙන් ද ලබා ගත හැක.

මෙම ටෙන්ඩර් ගැන වැඩි විස්තර කාර්යාල වේලාවන් හිදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

සී. දූපාලසිංහම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මාතලේ උප කොට්ඨාශය

වාරිමාර්ග කාර්යාලය,
මාතලේ, 1964 ජූනි මස 17 දින දීය.

7–156—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොට්ඨාශය

අනුරාධපුර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටැන්ඩර්පත් 1964 ජූලි මස 28 වැනි අඟහරුවාද පෙරවරු 10 දක්වා උතුරු මැද කොටසේ අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටැන්ඩර් විවෘත කිරීම එහිදී එදිනම කරනු ලැබේ:—

| ටෙන්ඩර් අංකය | | වැඩය | | ලියා පදිංචිය | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | රු. | | රු. |
| ඒ. එල්. 4 | ... | කිරිගොල්ලෑව වැව සහ දකුණු පැන්නුම අළුත්වැඩියා කිරීම ... ... | ... | 42,000 | ... | 50 |
| ඒ. එල්. 5 | ... | මුවඇටගම වැව් බැම්ම, වම් සොරොව්ව කුඩාගම වැවේ පෝෂිත ඇල වැඩිදියුණු කිරීම | ... | 45,000 | ... | 50 |
| ඒ. එල්. 6 | ... | මැකිච්චාව වැවේ දකුණු ඇල හා 1 සිට 5 දක්වා කුණු ඇලවල් යටතේ වාරිමාර්ග පහසුකම් | ... | 18,000 | ... | 25 |
| ඒ. එල්. 7 | ... | මැකිච්චාව වැවේ වම් ඇල යටතේ වාරිමාර්ග පහසුකම් ... ... | ... | 16,000 | ... | 25 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ.

3. වර්ෂ 1964 ජූලි මස 24 වැනි සිකුරාද වනතෙක් (එදින ඇතුළුව) කාර්‍යාලයීය වේලාවන් තුලදී අනුරාධපුර වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල පමණක් අයදුම්පත් ඉදිරිපත්කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම කොල සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර කිරීමට ඉඩ තිබේද? නැත්ද? යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉන්ජිනේරු තැන වෙත ඉදිරිපත්කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් වන ලෙස තැන්පත් මුදල් වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්‍යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත්කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත්කළ යුතුයි.

4. මේ සම්බන්ධයෙන් ගිවිසුම, වැඩ සැලසුම්, ආදි වැඩි විස්තර කාර්‍යාල වේලාවන් තුලදී වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

එම්. රත්නම්,
වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
අනුරාධපුර උ. කො.

1964 ජූනි මස 22 වනද,

7–219—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### වීරවිල ගොවිපළට එළිච්චියන් 500 ක් මිළදී ගැනීම

පහත සඳහන් විස්තරවලට අනුකූලව වීරවිල ගොවිපළට එළිච්චියන් 500ක් මිළට ලබාදීම සඳහා පේරාදෙණියේ, කෘෂිකම් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964.7.31 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**විස්තර :**

(අ) මාස 10යේ සිට 15 දක්වා වයසැති රාත්තල් 25ක් හෝ ඊට වඩා බර ඇති ශාරීරික ආබාධයන්ගෙන් තොර බෝවෙන රෝගවලින් මිදුන යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු මෙරට එළිච්චියන් විය යුතුය ;

(ආ) සෑම ටෙන්ඩරයක්ම එළිච්චියන් 50කට නොඅඩු සංඛ්‍යාවකට විය යුතුය ;

(ඇ) ටෙන්ඩරයෙහි දැක්වෙන මිළ ගණන් ටෙන්ඩර් විවෘත කරන දින සිට සති 6ක් දක්වාවත් නොවෙනස්ව තිබිය යුතුය ;

(ඈ) තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව දන්වා මාසයක් ඇතුළතදී සැපයීම ආරම්භ කර සම්පූර්ණ මාස හතරක් ඇතුළත නිම කළ යුතුය ;

(ඉ) අවශ්‍ය වුවහොත් ටෙන්ඩර්කරු විසින් සතුන්ගේ අයිතිය පිළිබඳ සහතිකයක් සතුන් පරීක්ෂා කරන අවස්ථාවේදී පළාතේ ග්‍රාම සේවක නිලධාරිගෙන් ඉදිරිපත් කළ යුතුය.

**සතුන් පරීක්‍ෂා කිරීම සඳහා තෝරාගැනීම :**

කෘෂිකම් අධ්‍යක්ෂ විසින් පත්කරන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සතුන් පරීක්ෂාකර තෝරාගන්නවා ඇත. එම තෝරාගැනීම පිළිබඳව අවසාන තිරණය එම මණ්ඩලයේ තීරණයයි. පරීක්ෂණයකට සතුන් 50ට නොඅඩු ප්‍රමාණයක් ඉදිරිපත් කළ යුතුය.

**තෝරාගැනීමේ ස්ථානය හා දිනය :**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව පාලන හා සෞඛ්‍ය) විසින් යථාකාලයේදී දන්වනවා ඇත.

2. ටෙන්ඩර් ආකෘති ලබාගැනීම සඳහා එක් එක් ටෙන්ඩර් ආකෘති යක් වෙනුවෙන් රුපියල් විසිපහ (රු. 25ක්) තැන්පත් කර එම කුවිතාන්සිය, කොළඹ 1, තැ. පෙ. 536, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්‍යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත් ඉදිරිපත් කළ යුතුය.

මුදල් තැන්පත් කිරීම පේරාදෙණියේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්‍යාලයේ හෝ කච්චේරියක හෝ නැතහොත් මහා භාණ්ඩාගාරයේ කළ හැකිය.

ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිසි ලෙස සම්පූර්ණකර අනුපිටපතකින් යුක්තව ලියුම් කවරයක බහා සීල් තබා "සභාපති ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකම් දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න ලියා එම ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ "වීරවිල සත්ව ගොවිපළට එළිච්චියන් සැපයීම" යන්නද ලියා එවිය යුතුය. 1964.7.31 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය.

ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ පොරොන්දු පත්‍රය අත්සන් කළ පසුය. පත්කරගත් ටෙන්ඩර්කරුවාට ඒ බව දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

3. ටෙන්ඩර් ආකෘති පුරවා එවන විට රිජිස්ටර් තැපෑලෙන් එවීමට උපදෙස් දෙමි. අතින්ම භාරදිය හැකි ටෙන්ඩර් පත්‍රද දෙවැනි ඡෙදයේ විස්තර අනුව සකස් කර පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. රිජිස්ටර් කර එවන ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත නොලැබුනහොත් ඒ ගැන, පේරාදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ, කෘෂිකම් අධ්‍යක්ෂකගෙන් විමසිය යුතුය.

4. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍යනම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාරගැනීමට නියමිත දිනයේ යටකී වේලාවේදී, පේරාදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ දී, ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

5. නියමිත ෆෝර්මවල ලියා නැති නියමිත කොන්දේසිවලට අනුකූල නොවන කිසිම ටෙන්ඩරයක්, ටෙන්ඩරයක් ලෙස සළකනු නොලැබේ. ප්‍රමාණයන් හා ගණන් පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතුය. ඒ සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන් ද තැබිය යුතුය. ටෙන්ඩර් කරන ලද ගණන් අකුරුවලින් මෙන්ම ඉලක්කම්වලින්ද සඳහන් කළ යුතුය. අකුරුවලින් දක්වා ඇති ගණන් ඉලක්කම්වලින් දක්වා ඇති ගණන්වලට වඩා වෙනස් නම් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ටෙන්ඩර් ආකෘතියේ පැහැදිලිව ලිවිය යුතුය.

7. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද මුළු වටිනාකමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයකට අත්සන් තැබීමට පත්කරනු ලැබූ කොන්ත්‍රාත් කරුට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ සේවාව නියම් ලෙස ඉටු කර අවසන් වූ පසුය. පත්කරන ලද ටෙන්ඩර්කරුවා මේ සේවාව නියම ලෙස ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැරහැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් වෙනවාද ඇත.

8. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගත් ටෙන්ඩර්කරුවාම දැරිය යුතුය.

9. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමට ද ටෙන්ඩර් පත්‍රයක කොටසක් පිළිගැනීමට ද, වුවමනා ප්‍රමාණයක් සපයන ලෙස නියම කිරීමට ද බලය ආණ්ඩුව තබාගන්නවා ඇත.

10. තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුය.

11. කොන්ත්‍රාත්කරුවාට භාරදිය යුතු සියළුම දැනුම්දීම් ඔහුගේ අතට දුනහොත්, නැතහොත් ඔහුගේ නියෝජිතයාට (සමාගමක නම් හෝ ව්‍යාපාරයක නම් නියෝජිතයා හෝ ලේකම්) දුනහොත් ඔහු විසින් සපයන ලද ඔහුගේ කන්තෝරුවේ/නිවසේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් ඒ ඔහුට භාරදුන්නාසේ සළකනු ලැබේ. යම් විදිය කින් කොන්ත්‍රාත්කරු ඔහුගේ කන්තෝරුවේ/නිවසේ ලිපිනය වෙනස් කර තිබේ නම් ඒ බව කෘෂිකම් අධ්‍යක්ෂ වෙත දැනුම්දිය යුතුය. කෘෂිකම් අධ්‍යක්ෂ වෙත ඒ බව දන්වන තුරු පොරොන්දු පත්‍රයේ සඳහන් වන ලිපිනයට සියළුම ලියුම් හා දැනුම්දීම් හෝ වෙනත් ලියවිලි යැවීමෙන් ඒවා භාරදුන් බවට ඒත්තු ගනු ලැබේ.

12. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කාරයින් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් කෙනකුගේ නම් සමග ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතුන් පිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුද්ධවන කිසිවකු සමග හෝ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු විසින් ඇප කරුවන් දෙදෙනකු සොයාගෙන ඔහුගේ වියදමින් ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුය. එම ඇපකරුවන් කෘෂිකම් අධ්‍යක්ෂ විසින් අනුමත කළ යුතුය.

13. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කොළඹ 1, තැ. පෙ. 536, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැකිය.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩබලන කෘෂිකම් අධ්‍යක්ෂක.

1964 ජූනි 22,
කොළඹ, ඩියුක් වීදියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේදීය.

7–37——64.7.3 දින අංක 14.092 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

**ගවයන් හංවඩුගැසීමේ උපකරණ සැපයීම හා ගෙන ගොස් භාරදීම**

ඉහත සඳහන් සැපයීම සේවාව සඳහා, කොළඹ, තැ. පෙ. 330, කෘෂිකම් ආහාර හා ධීවර පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964.7.31 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ පළවී ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකම් අධ්‍යක්ෂක.

1964.6.25 දින,
කොළඹ දී.

7–122—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව (නි.මි.යෝ.ක්‍රෑ. හා වි.කෙ.)

කොළඹ 7 එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 ස්ථානයෙහි (තැ. පෙ. 537) ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දක්වන ද්‍රව්‍ය ප්‍රමාණය මිළදී ගෙනයෑම සඳහා කැඳවනු ලබන මිළ ගණන් (කොටේෂන්ස්) 1964 ජූලි 17 වැනි සිකුරාද ආ. භා. 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

| ද්‍රව්‍ය | ගෝනි ගණන | දළ බර | | |
|---|---|---|---|---|
| | | හො. | කා | රා. |
| මෑ ඇට | ... 508 | ... 521 | 2 | 23 |

2. මේ සඳහා ටැන්ඩර් තැන්පත් මුදලක් හෝ විශේෂයෙන් පිළියෙල කළ ෆෝර්ම කොළ නැත. ටැන්ඩර්කරුවෝ තමන් විසින්ම පිළියෙල කරගත් ආකෘතියෙකින් මිළ ගණන් සඳහන් කොට ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "ටියුනීසියා ගබඩාවේ ඇති නි. මි. යෝ. ක්‍රෑ. ද්‍රව්‍ය සඳහා මිළ ගණන්" යනුවෙන් සඳහන් කොට සීල් තබා ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ස්ථානයෙහි ඇති ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

3. මරදානේ ටියුනීසියා මධ්‍යම ගබඩාවේදී රාජකාරි වේලාවන්හිදී (දුරකථනය අංක : 5216) මෙම ද්‍රව්‍ය පරීක්ෂා කිරීමට පුළුවන.

පි. ද සිල්වා,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1964.7.3,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

7–185—64.7.3 දින අංක 14,092 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොවිපළවලට සත්ව ආහාර සැපයීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගව මධ්‍යස්ථාන හා කෘෂිකර්ම ගොවිපළවලට පහත සඳහන් සත්වාහාර සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 ජූලි මස 31 වැනිදින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ :—

| සත්වාහාර | | | පස්මාසයකට වුවමනා කරන සාමාන්‍ය ප්‍රමාණය, හොණ්ඩර |
|---|---|---|---|
| ඉරිඟු කුඩු ... | ... | ... | 800 |
| තිරිඟු පරළු ... | ... | ... | 60 |
| විෂබීජ නැති කළ ඇට කුඩු | ... | ... | 60 |
| කඩල ... | ... | ... | 60 |
| වියළි කිරි මල් | ... | ... | 70 |

ඉහත සඳහන් වන්නේ 1964 අගෝස්තු සිට දෙමාසයක් තුළ වුවමනා කරන ප්‍රමාණයන්ය. සත්ව ආහාර හොඳ තත්වයක තිබීමත් හැර පහත සඳහන් විශේෂ ලක්ෂණයන් ද තිබිය යුතුය.

| සත්වාහාර | අදහස් කරන ලද විස්තර | සහතික කළ සංයෝගය |
|---|---|---|
| ඉරිඟු කුඩු ... ... | — ... | මාංශජනක ධාතු සියයට 10 ට නොඅඩු තෙතමනය සියයට 10 ට නොවැඩි, පිටස්තර දේ නොතිබිය යුතුය |
| තිරිඟු පරළු... ... | — ... | මාංශජනක ධාතු සියයට 17 ට නොඅඩු, තෙතමනය සියයට 10 ට නොවැඩි, පිටස්තර දේ නො තිබිය යුතුය. |
| විෂබීජ නැතිකළ ඇටකුඩු ... | වෙළඳාමට ගතහැකි පිරිසිදු ඇටකුඩු තම්බා කුඩුකිරීමෙන් සාදගන්නකි. ඇන්ත්‍රැක්ස්ක්ෂුද්‍රබීජ නැති බවට සහතික කළ යුතුය | පී 2 ඕ 5 සියයට 30–35, පිටස්තර දේ නො තිබිය යුතුය. |
| කඩල ... ... | — ... | මාංශජනකධාතු සියයට 22–23, තෙතමනය සියයට 12ට නොවැඩි, පිටස්තර දේ නොමැති, සතුන් විසින් නොවිදින ලද. |
| වියලි කිරිමල් ... | කිරි සැදීමේදී ලබාගන්නා කිරි මල් ... | මාංශජනක ධාතු සියයට 49 ට නොඅඩු, තෙතමනය සියයට 10 ට නොවැඩි, පිටස්තර දේ නොතිබිය යුතුය |

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත යුතුය. එම ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිවැරදිව පුරවා, අනුපිටපතකින් යුක්තව, කවරයක බහා, සීල්තබා ''සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය'' යන්න ලියා, එහි මුදුන් කෙළවරේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සත්ව ආහාර සැපයීමේ ටෙන්ඩර් පත්‍රය'' යන්න ලියා එවිය යුතුය.

5. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති ලබාගත හැකිය. 1964.5.8 දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති දෙනු ලැබේ. මුදල් තැන්පත් කිරීම, මහා භාණ්ඩාගාරයේ, හෝ ඕනෑම කච්චේරියක, නැතහොත් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ කළ හැකිය. මෙම තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ, කොන්ත්‍රාත් කරු දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් පත්‍රයකට අත්සන් තැබූ පසුය. පත්කරගත් කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දස දිනක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් තැබීමටත් නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කරනවා ද ඇත.

6. ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති නියමිත ලෙස සකස් කර පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් එකී ලිපිනයට රිජිස්ටර් තැපැලෙන් යැවිය යුතුය. රිජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ ඒජන්තවරු විසින් හෝ ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත අතින්ම භාරදිය යුතුය. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ ''සත්ව ආහාර සැපයීමේ ටෙන්ඩර් පත්‍රය'' යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය.

රිජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවකු විසින් එවැනි දන්වීමක් ටෙන්ඩර් විවෘත කිරීමට නියමිතව තිබූ දින සිට දින 4ක් ඇතුළත නොලද හොත්, ඒ ගැන පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුය.

7. සෑම ටෙන්ඩර් කරුවෙක් විසින්ම ඔවුන් විසින් ටෙන්ඩර් කරන ලද සෑම සත්ව ආහාරයක්ම රාත්තල් 6ක සැම්පලය බැගින් ''සත්ව ආහාර සැම්පල්'' යන්න ලියා 1964.7.24 දිනට හෝ ඊට පෙර, කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලැබීමට එවිය යුතුය. සැම්පල් එවීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ. සැම්පල් මිස ටෙන්ඩර් පත්‍ර නියෝජ්‍ය අධ්‍යක්ෂට නොඑවිය යුතුය. මේවා දුම්රියට ගෙවා එවිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින යටකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ඒවා විවෘත කරනු ලැබේ.

9. නියම පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වලට ටෙන්ඩර්කරුගේ කෙටි අත්සනද තැබිය යුතුවේ. ටෙන්ඩර් කරනලද ගණන් අකුරුවලින් සහ ඉලක්කම් වලින්ද ලිවිය යුතුය. ඉලක්කම්වලින් ලියන ලද ගණන් වචනවලින් සඳහන් කරන ගණන්වලට වෙනස් වුවහොත් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමටද ඉඩ තිබේ.

10. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

11. පළමුවෙනි වාක්‍ය ඛණ්ඩයෙහි සඳහන් සත්ව ආහාර සියල්ලටම හෝ එකකට හෝ ටෙන්ඩර් කළ හැක.

12. උවමනා අවස්ථාවක සත්ව ආහාර උවමනා ප්‍රමාණ සැපයීමට ටෙන්ඩර්කරුට පුළුවන් විය යුතුයි. මේ වග කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ සත්ව ආහාර තොගය යැවිය යුතු ළඟම දුම්රිය පළ ද සඳහන් කර තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරුවාට විටින් විට දන්වනු ලැබේ.

13. ටෙන්ඩරය භාරගත් බව දන්වා දස දිනක් ඇතුළත උවමනා ප්‍රමාණ සත්ව ආහාර සැපයීමට ටෙන්ඩර්කරුවන්ට හැකි විය යුතුයි.

14. තෝරා ගන්නාලද ටෙන්ඩර්කරු විසින් සත්ව ආහාර යවන අවස්ථාවේ දී ඒවායින් සැම්පලයක් පරීක්ෂණයටක භාජනය කළ යුතුයි. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් නම් කරන ලද නිලධාරියෙකුට විභාග කර බැලීම සඳහා සැම්පල් ගැනීමට පහසුකම් සැලැස්විය යුතුයි. මේ සැම්පල් නියම තත්වයට නොතිබුණි නම් සපයන ලද සියලුම සත්ව ආහාර ටෙන්ඩර්කරු හට දුම්රිය ගාස්තු ගෙවා භාර ගැනීමට ආපසු එවනු ලැබේ.

15. ටෙන්ඩරයෙහි සඳහන් කළ මිළ ගණන් දුම්රිය පෙට්ටිවලට පටවන ශුද්ධ බර ප්‍රමාණය අනුව විය යුතුයි. පැටවුම් ගාස්තු දෙපාර්තමේන්තුවෙන් ගෙවනු නොලැබේ. තෝරා ගන්නාලද ටෙන්ඩර්කරුවාට ඔහුගේ ගබඩාවත් බඩු එවන දුම්රිය ස්ථානයත් අතර සත්ව ආහාර ගෙනයෑමට යන වියදම් දරන්නට සිදුවේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, සත්ව ආහාරවලට යන මුළු වියදමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිම වූ විට පමණකි. පත් කරන ලද ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත. බැංකු සහතිකයක් වුව ද පිළිගනු ලැබේ.

17. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

18. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට දෙමසක් යනතුරු ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තිබිය යුතුයි.

19. සත්ව ආහාර සැපයීම පිණිස ගන්නා සියලුම මළු නොඉරුණු පිරිසිදු ඒවා විය යුතුයි. මේ සඳහා හිස් කවුපෝර මළු පාවිච්චි නොකළ යුතුයි. මෙම දෙපාර්තමේන්තුවේ රසඥතැන විසින් විභාග කරන ලද සත්ව ආහාර මොනයම් අවස්ථාවක දී නියම තත්ත්වයකට නොතිබුණි නම් ඒවා ආපසු යැවීමට යන වියදම් කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුයි.

20. ඉහත සඳහන් සත්ව ආහාර සියල්ලම සපයා දෙන ලෙස නියම කිරීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ඇප නොවේ. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමට ද වුවමනා ප්‍රමාණයන් සපයා දෙන ලෙස නියම කිරීමටද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

21. කොන්ත්‍රාත්කරු විසින් එක් එක් ගොවිපළකට යවන එක් එක් සත්ව ආහාර තොගයට බිල බැගින් නොයවා එක්එක් ගොවිපළකට මාසයක් තුළ දී සපයන ලද තොග සියල්ලට ම එක් බිලක් මාසය අවසානයේ දී යැවිය යුතුයි.

22. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු සත්ව ආහාර තබා තිබෙන ඔහුගේ ගබඩාව වසංගත රෝග බෝවන මැස්සන්ගෙන් තොරව ඉතා පිරිසිදු තත්ත්වයක තබාගත යුතුයි.

23. සත්ව ආහාර සපයන මළු ඒ ඒ ගොවිපළවල තිබෙන භාජනවලට ඒ බඩු දමාගත් පසු ආපසු එවනු ලැබේ. ඒවා එවීමට යන වියදම කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුයි.

24. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් යෙදවිය යුතුයි.

ඒ වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදවිය යුතු වග කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් හැටියට සලකනු ලැබේ. තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරුට මේ කොන්දේසිය ඉටු කිරීමට නොහැකි වුවහොත් කොන්ත්‍රාත්තුව කඩ කිරීමකැයි සලකා එය අවලංගු කරනු ලැබේ. විශේෂ අවස්ථාවන්හි කොන්ත්‍රාත්කරුට ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට හැකි වන්නේ කොළඹ, කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනගේ අනුමැතිය පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ අවසරය පළමුව ලියවිල්ලකින් ලබා ගත්තාට පසුවය. එවැනි අවසරයක් නොමැතිව ලාංකිකයන් නොවන කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් වශයෙන් සලකනු ලැබේ.

"ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

25. තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

26. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැනුම්දීම ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහුගේ නියෝජිතයාට (සමාගමක් නම් ව්‍යාපාරයේ නියෝජිතයා හෝ ලේකම්තැන) දුන්නොත් ඔහු විසින් සපයන ලද ඔහුගේ කන්තෝරුවේ/නිවසේ ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඒ ඔහුට භාර දුන්නා සේ සලකනු ලැබේ. යම් විධියකින් කොන්ත්‍රාත්කරු ඔහුගේ කාර්යාලය/නිවාසය හෝ ලිපිනය වෙනස් කර තිබේ නම්, ඒ බව කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුයි. කෂිකර්ම අධ්‍යක්ෂ වෙත දැන්වීමකින් ඒ බව දන්වන තුරු පොරොන්දු පත්‍රයේ සඳහන් වන ලිපිනයට සියළුම ලියුම් හෝ දැන්වීම් හෝ වෙනත් ලියවිලි යැවීමෙන් ඒවා භාරදුන් බවට ඒත්තු ගනු ලැබේ.

27. යම්කිසි වැඩකරුවෙක් මේ වැඩෙහි යෙදවීම ගැන විරුද්ධවීමට බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

28. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට ඉහත සඳහන් සත්ව ආහාර සියල්ලක් ම මිළට නොගත යුතු යැයි පෙනී ගිය හොත් එසේ මිළයට නොගැනීම හේතුකොට ගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ගැනීමට ඔහුට බලයක් නොලැබේ.

29. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කාරයන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් කෙනෙකුගේ නම සමග ඇතුළත් වූ හෝ තමාට සැහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

30. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනෙකු සොයාගෙන ඔහුගේ වියදමින් ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විසින් අනුමත කළ යුතුයි.

31. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන මිළ ගණන් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

32. සපයන ලද සත්ව ආහාර සතුටුදයක නොවීමත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට තබාගනු ලැබේ.

33. වැඩි විස්තර කොළඹ සත්ව පාලනය හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැක. එසේ එවන ලියුම් පහත සඳහන් අයගේ නමට නොඑවිය යුතුයි.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964.6.27
කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී.

7-166—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ජල සම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව

මැදවච්චිය ජලසම්පාදනය කිරීම සඳහා එවන ටැන්ඩර් පත්‍ර කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා දින පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන වේලාව වන එදින පෙරවරු 10.35ට ටැන්ඩර්කරුවන් පැමිණිය යුතුය.

2. රත්මලානේ ජල සම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැන (ඉදිකිරීම සහ නඩත්තු) ගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටැන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඒ කාර්යාලයෙන් බලා ගත හැකිය.

3. ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ "අ", "ආ" සහ "ඇ" අංශ යන්හි ලියාපදිංචිවී ඇති අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වෙත් :—

(අ) ලියාපදිංචිය පිළිබඳ ලියවිලි ;

(ආ) ටැන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

මේවා ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1964 ජූලි මස 24 වැනි සිකුරාදා දවල් 12 ට පෙර ඉදිරිපත් කළ යුතුය.

4. ටැන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන විට, මේ හා සමාන වෙනත් වැඩ කර ඇති බවට හා යෝජිත වැඩය භාර ගැනීමට සුදුසු නිලධාරීන් සිටින බවටත්, සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටැන්ඩර් සඳහා තැන්පත් මුදල්, රත්මලානේ, ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

සී. රාසයියා,
ජල සම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක.

1964 ජූලි මස 29 වැනිදා,
රත්මලානේ, ජලසම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේ දීය.

7-245—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1964/1965 වර්ෂයේ ප්‍රථම භාගය සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම

පහත සඳහන් ව්‍යාපාරයන් වෙනුවෙන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා පොලොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1964.7.21 දින පෙ. ව. 10 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එක් එක් ව්‍යාපාරය සඳහා ටෙන්ඩර් පත්‍ර වෙන් වෙන් වශයෙන් විය යුතුයි :—

1. මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් මාන්කේනි, පනිච්චන්කේනි සහ වඩුමුනෙයි ව්‍යාපාර සඳහා.
2. මාතලේ දිස්ත්‍රික්කයට අයත් හත්තොට අමුණ, දඹුල්ල, කන්ඩලම සහ විල්ගමුව ව්‍යාපාර.
3. පොලොන්නරුවේ තමන්කඩුව දිස්ත්‍රික්කයට අයත් කවුඩුළු වැව, මින්නේරිය, ගල්අමුණ, පොලොන්නරුවේ පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය, පොලොන්නරුවේ සත්ව පර්යේෂණ මධ්‍යස්ථානය, පොලොන්නරුවේ මධ්‍ය මහා විද්‍යාලයය, පොලොන්නරුවේ පොදු ගොඩනැගිලි අංශය, මාදුරුඔය, කන්දකාඩුව, ත්‍රිකෝණමඩු සහ හිඟුරක්ගොඩ යන ව්‍යාපාර.

### අවශ්‍ය ගොඩනැගිලි උපකරණ විස්තර

1. පොල් අතු (දිගින් අඩි 7 ට අඩු නොවූ අඟල් 18 ක් පළල්වූ ඉරු දෙකේ පොල් අතු 1,000 බැගින්)
2. අළු හුණු (බුසල් ගණනින්)—(බුසලක් රු. 44 කට අඩු නො විය යුතුයි.)
3. නම්බාපු හුණු (බුසල් ගණනින්)—(බුසලක් රු. 85 කට නො අඩු)
4. කළුගල් (කියුබ් ගණනින්—අඟල් 6 සිට 9 දක්වා)
5. තලාපු ගල් (කියුබ් ගණනින්) 3/4" ප්‍රමාණය.
6. තලාපු ගල් (කියුබ් ගණනින්) 1" ප්‍රමාණය.
7. තලාපු ගල් (කියුබ් ගණනින්) 1 1/2" ප්‍රමාණය.
8. තලාපු ගල් (කියුබ් ගණනින්) 2" ප්‍රමාණය.
9. පිළිස්සූ ගඩොල් (සම්මත ප්‍රමාණය 8 3/4" × 4 1/2" × 2 3/4"—1,000 බැගින්) පෝරණුවේ සිට වැඩපොළට හැ. 5 කට වැඩි නො විය යුතුයි.
10. ගංගා වැලි (කියුබ් ගණනින්).

2. ගෙනැවිත් භාරදීම සඳහා වෙන වෙනම මිල ගණන් දැක්විය යුතුය.

(අ) වත්තෙන්, පෝරණුවෙන්, ගල්වලෙන් (ලොරිය ගෙනගිය හැකි විය යුතුයි)

(ආ) වැඩපොළට.

3. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් මෙම කායාීලයයේ හෝ කච්චේරියේ හෝ ඒ ඒ ව්‍යාපාරයට වෙන වෙනම රු. 50 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

4. 1964 ජූලි මස 20 වැනි දින පෙ. ව. 11 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් මා නියෝග කරනු ලබන දින සිට සති දෙකක් ඇතුළතදී උපකරණ සැපයිය යුතුයි. යමෙක් එය පැහැර හැරිය හොත් හෝ සැපයීමට අසමත් වුවහොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නමද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

6. කැමති ටෙන්ඩර්කරුවෙකුට, ටෙන්ඩර් විවෘත කරන වේලාව වන 1964.7.21 දින පෙරවරු 11 ට ඉදිරිපත් විය හැකිය.

7. වැඩි විස්තර පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන ගෙන් ලබාගත හැකිය.

එම්. අයි. එම්. නලීර්,
පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිළධාරි.

1964 ජූනි මස 20 වැනි දින.
පොළොන්නරුවේ,
ඉඩම් සංවර්ධන කායාීලයේ දීයැ.

7-238—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු මෝටර් රථවාහන විකිණීම සඳහා ටෙන්ඩර්

කොළඹ ඇව්ලන් චතුරශ්‍රයෙහි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින්, කිරිලපොන (කොළඹ 6) මධ්‍යම වැඩපොලෙහි සේවයට නුසුදුසු පහත සඳහන් රථවාහන විකිණීම සඳහා ටෙන්ඩර් 1964 ජූලි මස 17 වෙනි දින, පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ :—

#### වාහන පිළිබඳ විස්තර

1. සී. වයි. 1175 ඩොජ් ලොරිය (පැට්‍රල්)
2. සී. එල්. 9843 බෙඩ් පෝර්ඩ් ලොරිය (පැට්‍රල්)
3. සී. එන්. 1415 මොරිස් කොමාෂල් ලොරිය (පැට්‍රල්)
4. සී. එන්. 1452 මොරිස් කොමාෂල් ලොරිය (පැට්‍රල්)
5. ඊ. වයි. 4904 විලිස් ජීප් (පැට්‍රල්)
6. අයි. සී. 1088 ඔස්ටින් ලොරිය (ඩීසල්)
7. අයි. සී. 1104 ඔස්ටින් ලොරිය (ඩීසල්)
8. අයි. සී. 1112 ඔස්ටින් ලොරිය (ඩීසල්)
9. අයි. සී. 1114 ඔස්ටින් ලොරිය (ඩීසල්)
10. අයි. සී. 1123 ඔස්ටින් ලොරිය (ඩීසල්)
11. අයි. සී. 1131 ඔස්ටින් ලොරිය (ඩීසල්)
12. අයි. සී. 1148 ඔස්ටින් ලොරිය (ඩීසල්)
13. අයි. සී. 1154 ඔස්ටින් ලොරිය (ඩීසල්)
14. අයි. සී. 1382 ඔස්ටින් ලොරිය (ඩීසල්)
15. අයි. සී. 1670 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
16. අයි. සී. 1835 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
17. අයි. සී. 1947 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
18. අයි. සී. 1953 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
19. අයි. සී. 1987 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
20. අයි. සී. 1995 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
21. අයි. සී. 1997 පෝර්ඩ්සන් ලොරිය (ඩීසල්)
22. අයි. සී. 3575 ඔස්ටින් (බී. ඇම්. සී.) ලොරිය (ඩීසල්)
23. අයි. සී. 3592 ඔස්ටින් (බී. ඇම්. සී.) ලොරිය (ඩීසල්)
24. අයි. සී. 3778 ඔස්ටින් (බී. ඇම්. සී.) ලොරිය (ඩීසල්)
25. අයි. සී. 2160 පෝර්ඩ්සන් බවුසර්

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් 1964 ජූලි මස 16 වෙනි දින දවල් 12 වන තෙක් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළයුතුයි. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයෙහි හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රුපියල් 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පෝර්ම බහාලූ කවරය මුද්‍රාද තබා එහි උඩ වම් කෙළවරෙහි ''සේවයට නුසුදුසු රථවාහන මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ඇව්ලන් චතුරශ්‍රය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපැලෙන් හෝ තමා විසින්ම ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාරදී ලැබුන බව හැඟවීමේ කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. කොළඹ ඇව්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1964 ජූලි මස 17 වෙනි දින, පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේ පෙනී සිටිය හැක.

5. ටෙන්ඩර් කිරීමට අපේක්ෂා කරන්නන් එසේ කිරීමට ප්‍රථමයෙන් කිරිළපොන මධ්‍යම වැඩපොලෙහිදී, වාහන පරීක්ෂා කළයුතුයි. ටෙන්ඩරයේ ඇතිවන සියළුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළයුතුයි.

6. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල දින 10 ක් ඇතුළත දි ගෙවිය යුතුයි. ඊට පසු දින 14 ක් ඇතුලතදී ගන්නා ලද වාහන අස්කර ගතයුතුයි. බැහැර කිරීම සඳහා තමන් විසින්ම පිළිවෙලක් යොදගත යුතුයි. නියමිත කාලය තුළදී අස්කරගනු නොලබන සියළුම වාහන ආදිය නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනුදැනුම ඇතිව විනා අන්කිසි අයුරකින් වාහන සඳහා ඉදිරිපත් විය නොහැක. යම් හෙයකින් සාර්ථකවූ ටෙන්ඩර් කරු කොන්ත්‍රාත්තුව පැහැර හැරියහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව රජයේ කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඔහුගේ නම ඇතුලත් වන්නේය.

7. කැමති වාහන ගණනකට හෝ සියල්ලටම ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර, ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාරගැනීමේ හෝ නොගැනීමේ අයිතිය, රජය සතුය.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇව්ලන් චතුරශ්‍රය, කොළඹ 1.
1964......මස...... දින.

7-239—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### ද්‍රව පිලි, හා ආවරණ කම්බි ඇහුරුම් සහ ආවරණ ආදිය සැපයීමේ සහ භාරදීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964 ක්වූ සැප්තැම්බර් මස 1 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දිය යුතුයි. පිට කවරයේ ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය සහ සේවයේ විස්තරද සඳහන් කොට ටෙන්ඩර් මණ්ඩලයේ ටෙන්ඩර් භාර ගැනීමේ බලයලත් සභාපති තැනට භාරදිය යුතුයි.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝරම වලයි. වර්ෂ 1964 ක්වූ අගෝස්තු මස 28 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964 ක්වූ සැප්තැම්බර් මස 1 වන අඟහරුවාදා පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. මුතුබාලසූරියර්,
වැ. බ. රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1964 ක්වූ ජූලි මස 3 වෙනි දින දීය.

7–32—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය.

---

## උඩපත්තු නවදුන් කෝරලේ ගම් සහා ප්‍රදේශයේ දෙනවක ගඟ හරහා පාලම තැනීම

ඉහත සඳහන් පාලම ඉදිකිරීම සඳහාවූ ටෙන්ඩර් පත්‍ර 1964 ජූලි මස 23 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 වනතෙක් ම විසින් භාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට කාර්යාලයට පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ කොළඹ, ලෝටස් පාරේ අංක 54රේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු වරයා වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩය පිළිබඳ සැලසුම් එම කාර්යාලයේදී බැලිය හැකිවන අතර, ඒ පිළිබඳ සියලු විස්තර හා තොරතුරුද ඔහු වෙතින් ලබාගත හැක.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රු. 1,00,000කට නොඅඩු වැඩ සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් කිරීමට සුදුසුකම් ලබා ඇති අතර, ඔවුන් විසින් ඒ වෙනුවෙන් 1964 ජූලි මස 17 වැනි සිකුරාද සවස 4.30 ට පෙර ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත (අ) එසේ ලියාපදිංචිවී තිබීම පිළිබඳ සාධකත් (ආ) රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහාවූ කුවිතාන්සියක් ඉදිරිපත් කර සිටිය යුතුවන්නේ ය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹින් පිටත ඕනෑම කච්චේරියකට හෝ කොළඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවට හෝ ගෙවීමට පුලුවන.

ඩබ්ලිව්. ඩී. වී. මහතන්තිල,
පළාත් පාලන කොමසාරිස් තැන.

පළාත් පාලන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500, කොළඹ, 26.6.64.

7–223—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය.

---

## සේවයට අයෝග්‍ය මෝටර් රථ විකිණීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

ඉහත සඳහන් මෝටර් රථ විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක්වූ ජූලි මස 28 වන අඟහරුවාදා පූ.භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගතහැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් තුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝරම වලයි. වර්ෂ 1964ක්වූ ජූලි මස 24 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

වර්ෂ 1964ක්වූ ජූලි මස 28 වන අඟහරුවාද පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. මුතුබාලසූරියර්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ වැ. බ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ, 1964ක්වූ ජූලි මස 3 වෙනි දින දීය.

7–152—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බඩු බාහිර ගෙනයාම සඳහා ටෙන්ඩර් කැඳවීම

මහනුවර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා අධිකාරී තුමා විසින් එම දිස්ත්‍රික්කයේ වෛද්‍ය ආයතන වලට දුම්රිය පොල වල සිට හා දුම්රියට බඩු භාර ගන්නා ස්ථාන වල සිට 1964.10.1 සහ 1966.9.30 කාලය අතර තුර බඩුබාහිරාදිය ගෙනයෑම සඳහා මෙයට යාකර තිබෙන උප ලේඛණයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙ.ව. 10 ය දක්වා ලාංකිකයන් ගෙන් හා ලාංකික වෙළඳ සමාගම් වලින් වෙන් වෙන් වශයෙන් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. මෙහි පහත දැක්වෙන උප ලේඛණයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙ.ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම වසා එකෙනෙහිම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට එතනට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් ද ඔවුන්ගේ ගාස්තු ප්‍රමාණයද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට අවශ්‍ය නම්, සෞඛ්‍ය සේවා අධිකාරී තුමාගෙන් හෝ ඔහුගේ නියෝජිතයාගෙන් හෝ අවසර ලබා ගෙන ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයක දෙවන පිටපත පරීක්ෂා කිරීමට හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර මේ කාර්යාලයෙන් හෝ කොළඹ, කළුතර, ගාල්ල, මාතර, බදුල්ල, මාතලේ, නුවර, කුරුණෑගල, කෑගල්ල, පුත්තලම, මඩකලපුව, අනුරාධපුර, වව්නියා සහ යාපනය යන ඕනෑම සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයකින් ලබා ගතහැකි ෆෝරම වල ලියා පිටපත් දෙකක් ඉදිරිපත් කළයුතුයි. ටෙන්ඩර් පත්‍ර අයදුම්කරුවන් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා පහත සඳහන් උප ලේඛණයේ දෙවැනි තීරයේ සඳහන් මුදල කච්චේරියක තැන්පත් කළ මුදල් කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍ර වසන දිනයට පෙර දින මධ්‍යාහ්නයේ 12 ට පෙර ඉදිරිපත් කළයුතුය. අනුමත කරන ලද

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන ලද මිළ ගණන් අඩු වශයෙන් මාස 3 ක කාලපරිච්ඡෙදයක් දක්වා වලංගු විය යුතුයි.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතුද වන්නේය. එම කොන්දේසි වලට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කළ හැකි බැවිනි.

11. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාරගැනීමද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුව ඇත.

12. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දන ගත හැකිය.

ඇස්. ඥාණසේගරම්,
වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1964 ජූනි මස 29 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
කොළඹ.

## උපලෙඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| කොළඹ වෛද්‍ය පර්යේෂණායතනයට සහ කොළඹ මහා ආරෝග්‍යශාලාවට සතුන් සැපයීම ... ... | 100 ... | 800 ... | 1964.7.28 දින පෙ.ව. 10 ට |

## උපලෙඛනය (දළ වශයෙන්)

| | | | |
|---|---|---|---|
| වඳු පැටවුන් | ... | ... | 200 |
| මීහරක් පැටවුන් | ... | ... | 2 |
| බැටලුවන් | ... | ... | 35 |
| එලුවෝ | ... | ... | 700 |
| හාවන් | ... | ... | 200 |
| ගිනි පිග්ස් | ... | ... | 55 |
| මැඩියන් | ... | ... | 7,700 |

7–225/1—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අමු ආහාර ද්‍රව්‍ය සැපයීම

වර්ෂ 1964 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1965 සැප්තැම්බර් මස 30 වෙනි දයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමු වැනි තීරයෙන් දක්වා ඇති ආයතනයන්ට අමු ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ තැ.පෙ. 500, සෞඛ්‍ය අමාත්‍යාංශයේදී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964.7.28 වැනි දින දක්වා ලාංකිකයන්ගෙන් හෝ ලංකා වෙළඳ ආයතන වලින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ටෙන්ඩර් ෆෝර්මවල, කොළඹ ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ තැ.පෙ. 500 සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත අනු පිටපතක් සමග ටෙන්ඩර් සැපයිය යුතුයි. නියමිත ෆෝර්මයේ නොවන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

3. මේ සමග ඇති උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් ප්‍රමාණයේ මුදලක්, මගේ නමට කොළඹ කච්චේරියේ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සි ටෙන්ඩර් ලබාගැනීමට ප්‍රථම ලබාගත යුතුයි. ලංකා බැංකුවෙහි මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය ෆෝර්ම කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත ෆෝර්මයේ නොවන ටෙන්ඩර් පත් ලංකා බැංකුව භාර නොගනු ලැබේ.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් ටෙන්ඩර් තැන්පත් මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථම දින දවල් 12 ට කලින් ඉදිරිපත් කිරීමෙන්, අවශ්‍ය ෆෝර්ම, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැක. තැපෑලෙන් ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කරන අය, කල්වේලා ඇතිව ඉහත කී කුවිතාන්සිය එවා ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ටෙන්ඩර්, භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවිය යුතුය.

4. සැම ටෙන්ඩරයක්ම කොළඹ තැ.පෙ. 500 සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කටර සේවාවන් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත් කොළඹ ගාලු මුවදොර මහාලේකම් කාර්යාලයෙ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නො. 155 දරණ කාමරයේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට සිය ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි තැපෑලෙන් ද එවිය හැක. ටෙන්ඩර් කරුවන් සිය ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවීමට අසතුටු නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට මෙහි පළමුවන ඡෙදයේ සඳහන් ලිපිනයේ ඇති ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසරය ඇති සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට පුද්ගලිකව ටෙන්ඩර් පත්‍ර භාරදී එය ලැබුණු බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර්පත් භාර ගැනීමේ අවසාන දින දවල් 10 පසුවී තැපැලෙන් හෝ පැමිණ භාර දෙන සැම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුගේ නම සහ ඔවුන්ගේ ටෙන්ඩර් පත්වල සඳහන් මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ.

යම්කිසි ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩර්පත් පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැක.

6. මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වර්තනාකම් පිළිබඳ තොරතුරු මා වෙත දන්වා සිටිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය ෆෝර්ම මාගෙන් ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දන ගැනීමට පෙර ටෙන්ඩර් පත්‍ර පිළිබඳ තීරණයක් කළ නොහැක. එබැවින් තම තමන්ගේ වර්තනාකම පිළිබද වාර්තාවක් එවිය යුතුය.

7. වර්ෂ 1963 අප්‍රේල් 1 ද සිට 1964 මාර්තු 31 ද දක්වාවූ කාලය තුළ ලබාගත් ආහාර ප්‍රමාණයේ විස්තරයක් මෙහි පහත දක්වා ඇත. ටෙන්ඩර් මණ්ඩලයේ අවසාන තීරණය රඳා පවත්නේ වියදම් වූ මුළු මුදල අනුවයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන ලද මිළ ගණන් අඩු වශයෙන් මාස 3 ක කාලපරිච්ඡෙදයක් දක්වා වලංගු විය යුතුය..

9. තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය තැන්පත් කර තබනු සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළකා නොදෙනු ලැබේ.

10. ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රය පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු වන්නේය.

ඇස්. ඥාණසේගරම්,
වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1964.7.3 දින.
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශය, කොළඹ

## උපලෙඛනය

(1) සේවය : අමු ආහාර ද්‍රව්‍ය සැපයීම—පැලවත්ත මානසිකාරෝග්‍ය ශාලාව.

(2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් : රු. 100.

(3) ඇප මුදල රු. 1,000.

(4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව : 1964.7.28 දින.

| ද්‍රව්‍යවල නම් | | | | ගණන රාත්තල් |
|---|---|---|---|---|
| I වන කොටස— | | | | |
| හරක් මස් | ... | ... | ... | 9,450 |
| සූප්මස් | ... | ... | ... | — |
| සූප්කටු | ... | ... | ... | — |
| පිකුදු හරක් | ... | ... | ... | — |
| එළුමස් | ... | ... | ... | — |
| එළු පිකුදු | ... | ... | ... | — |
| සූප් මස් | ... | ... | ... | — |
| II වන කොටස— | | | | |
| තෝරමාලු | ... | ... | | — |
| පරා මාළු | ... | ... | ... | — |
| කෙලවල්ල | ... | ... | ... | 1,525 |
| මුදිල්ල | ... | ... | ... | |
| ගිනෙත්ති | ... | ... | | |
| කොඩුව | ... | ... | | |
| මී වැටිය | ... | ... | | |

| ද්‍රව්‍යවල නම් | ගණන රාත්තල් |
|---|---|
| තුම්බය | — |
| ගල් මාළු | 200 |
| වෙනත් හොඳ මාළු වර්ග | — |
| බලය | 1,575 |
| ඇටවල්ල | — |
| කට්ට | 1,700 |
| වින්මාළු | 1,150 |
| **III වන කොටස—** | |
| කුකුල් මස් | — |
| බිත්තර (අ.4–6) | 3,725 |
| කුකුල් පැටව් | — |
| **IV වන කොටස—** | |
| මයිසූර් පරිප්පු | 1,700 |
| මට්ට පරිප්පු | — |
| කඩල පරිප්පු | 8,950 |
| තෝරපරිප්පු | 3,600 |
| මුංඇට | 3,950 |
| පරා කරවල | 1,700 |
| කට්ට කරවල | 1,375 |
| වෙනත් කරවල | 400 |
| **කුළුබඩු වර්ග හා වෙනත් ද්‍රව්‍ය** | |
| වියලි මිරිස් | 1,400 |
| කුරුඳු | — |
| කොත්තමල්ලි | 400 |
| මාදුරු | 150 |
| සූදුරු | 400 |
| උළුහාල් | 50 |
| සුදුළූනු | 125 |
| ඉගාරක | 100 |
| උම්බලකඩ | 100 |
| අබ | 50 |
| රතුළූනු | — |
| ගම්මිරිස් පිටි | — |
| දියළුනු | 2,550 |
| ගම්මිරිස් | 100 |
| මෙයලූනු | — |
| සියඹලා | 275 |
| කහ | 125 |
| විනාකිරි (බෝතල්) | 100 |
| **විවිධ බඩු—** | |
| අරරූප් පුටි | — |
| බාර්ලි | 1 |
| බට්රිල් | — |
| බටර් | 100 |
| පොල්තෙල් (අ. 26 යේ බෝතල්) | 575 |
| කෝපිඇට | 5 |
| ජෑම් | 150 |
| සුදුසීනි | 7,625 |
| දුඹුරු සීනි | — |
| තේ බී.ඕ.පී. | 1,100 |
| වතුර (ගැලුම් 100) | — |
| බුලත්—දුම්කොල | — |
| පුවක් | 8,825 |
| බුලත් | 250 |
| හුනු ... | 75 |
| දුම්කොල | 650 |
| **V වෙනි කොටස—එළවළු** | |
| මුරුන්ග කොල | — |
| ගොටුකොල | — |
| මුකුණු වැන්න | 2,725 |
| තම්පල... | 1,525 |
| නිවිති | 1,575 |
| කතුරු මුරුන්ග | — |
| කංකුන් | 2,325 |
| කොහිල කොල | — |
| සාරන | 1,550 |
| අගාවා | 2,825 |
| **2 වන කොටස එළවළු (ගෙඩිවර්ග)—** | |
| වම්බටු | 2,150 |
| බන්ඩක්කා | — |
| බොම්බයිලූනු | 2,025 |

| ද්‍රව්‍යවල නම් | ගණන රාත්තල් |
|---|---|
| මැකරල් | 1,225 |
| මුරුන්ග | 1,500 |
| කෙසෙල් ගෙඩි | 2,100 |
| තක්කාලි | 1,900 |
| කරවිල... | — |
| වට්ටක්කා | 2,125 |
| පතෝල | 1,400 |
| **3 වන කොටස එළවළු—** | |
| මයියොක්කා | 150 |
| අර්තාපල් | 2,975 |
| බතල ... | 1,000 |
| ඉන්නල | 1,325 |
| වැල්අල | 1,925 |
| කිරිඅල | 1,975 |
| දෙල් ... | — |
| කොස් ... | 1,400 |
| බීට්රූට් | — |
| **4 වන කොටස—** | |
| බටර් බෝන්චි | — |
| සැල්දිරි | — |
| මුරුංග බෝන්චි | — |
| කොලිප්ලවර් | — |
| ලීක්ස් ... | — |
| පාර්නිප්ස් | — |
| කැරට් | — |
| ටර්නිප් | — |
| රාබු ... | 1,725 |
| නෝකෝල් | 700 |
| **පළතුරු—** | |
| බෙලි ... | — |
| පොල් | 22,625 |
| තැඹිලි ... | — |
| දෙහි ... | 7,325 |
| දෙඩම් මෙරට | 100 |
| ගස්ලබු ඉදුනු | — |
| කපු අන්නාසි | — |
| අන්නාසි මුරියි | — |
| කෝලිකුට්ටු | — |
| ඉදිනු කෙසෙල් හොඩරවාලු | 2,21,950 |
| තක්කාලි ඉදුනු | — |
| නොයෙක් මිරිස් වර්ග | 550 |
| ඉඟුරු ... | 50 |
| කරපිංච | 25 |
| රම්පෙ ... | — |
| සේර ... | — |
| **6 වන කොටස—** | |
| තිරිඟු පිටි | — |
| සුදු පාන් | 64,650 |
| දුඹුරු පාන් | — |
| බනිස් | — |
| විස්කෝතු | — |
| **හාල්පිටි කෑම—** | |
| ආප්ප (අ. 3 සිට 4 දක්වා) | — |
| ඉඳි ආප්ප | — |
| පිට්ටු | — |
| **8 වන කොටස—** | |
| මෙරට හාල් | — |
| මිල්වාඩ | 59,450 |
| රට කැකුලු හාල් | — |
| මෙරට කැකුලු හාල් | — |
| වී ... | — |
| **9 වන කොටස—** | හොණ්ඩර |
| පලාපු දර | 2,000 |

7–225/2—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1964 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1965 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන්වන ආයතනයන්ට, පිටිකිරි දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කායර්‍යාලවල) ද සීනි, සමුපකාර තොග ගබඩාවල සිට සෞඛ්‍ය කායර්‍යාලවලටද සෞඛ්‍ය කායර්‍යාලවල සිට කිරි මධ්‍යස්ථානවලටද ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කායර්‍යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කායර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොන ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොකරන අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු පිටිකිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, මාතලේ " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලද ටෙන්ඩර්පත් මෙම කායර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම මගේ කායර්‍යාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛණයේ 4 වන ඡෙදයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කරගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉක්මවන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දන ගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දනගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් විමසන්න.

පී. තඩරාසා,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1964 ජූනි මස 23 වෙනි දින දී,
මාතලේ, සෞඛ්‍ය සේවා අධිකාරී කායර්‍යාලයේ දීය.

### උපලේඛනය

| සේවය | ප්‍රදේශය | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය: පිටිකිරි හො. | සීනි හො. | අවසාන දිනය |
|---|---|---|---|---|
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, මාතලේ සමුපකාර බඩු ගබඩාවේ සිට සීනිද, මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායර්‍යාලයට සහ මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායර්‍යාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... ... ... | මාතලේ ... | 12½ ... | 5 ... | 4.8.64 |
| කදුරුවෙල දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, තමන්කඩුව සමුපකාර සංගමයේ සිට සීනිද, පොලොන්නරුවේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායර්‍යාලයට සහ පොලොන්නරුවේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායර්‍යාලයේ සිට පොලොන්නරුවේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලටද ... ... | පොලොන්නරුව ... | 12 ... | 5 ... | 4.8.64 |
| කැකිරාව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, දඹුල්ල සමුපකාර සංගමයේ සිට සීනිද, දඹුල්ලේ සෞඛ්‍ය කායර්‍යාලයට සහ දඹුල්ලේ සෞඛ්‍ය කායර්‍යාලයේ සිට දඹුල්ලේ සෞඛ්‍ය කායර්‍යාලය භාර නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලටද ... ... | දඹුල්ල ... | 11 ... | 4 ... | 4.8.64 |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, මාතලේ සමුපකාර සංගමයේ සිට සීනිද, රත්තොට සෞඛ්‍ය කායර්‍යාලයට සහ රත්තොට සෞඛ්‍ය කායර්‍යාලයේ සිට රත්තොට සෞඛ්‍ය කායර්‍යාලය භාර නිළාධරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | රත්තොට ... | 30 ... | 12 ... | 4.8.64 |

7-63—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1964 ඔක්තෝබර් 1 වෙනිද සිට 1965 සැප්තැම්බර් 30 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනයේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍ය්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍ය්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්‍ය්‍යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ‘‘ සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය ’’ කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළයුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍ය්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍ය්‍යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කර ගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ‘‘ බී ’’ උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ‘‘ සී ’’ උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙණෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගතයුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍ය්‍යාලය,
යාපනය, 3.7.64.

ජී. ඇන්. ආර්. නැතැනියල්,
සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය

### උපලේඛනය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | සේවකයින්ට | | | | රෝගීන්ට | | | |
| | | | | මාළු | මස් | කරවල | එළවලු | මාළු | මස් | කරවල | එළවලු |
| | රු. | රු. | | | | | | | | | |
| 1. රජයේ රෝහල, ඩෙල්ෆ්ට් ... | 100... | 800 | 4.8.64 පෙරවරු 10 ට | 1,025... | — ... | 400... | 1,625... | 1,025... | — ... | 350... | 1,625 |
| 2. රජයේ රෝහල, පුංගුඩුතීව් ... | 100... | 600 | | 1,250... | — ... | 1,250... | 1,875... | 1,600... | — ... | 1,600... | 2,400 |
| 3. ග්‍රාමීය රෝහල හා මාතෘ නිවාසය, පලෙයි ... ... | 100... | 600 | | 500... | — ... | 975... | 1,950... | 675... | — ... | 1,350... | 2,825 |
| 4. ග්‍රාමීය රෝහල හා මාතෘ නිවාසය, වන්කාලෙයි ... ... | 100... | 600 | | 500... | — ... | 250... | 1,000... | 1,000... | — ... | 500... | 2,000 |
| 5. ග්‍රාමීය රෝහල හා මාතෘ නිවාසය, කෝපායි ... ... | 100... | 400 | | 475... | — ... | 450... | 700... | 1,550... | — ... | 1,650... | 2,475 |
| 6. ග්‍රාමීය රෝහල හා මාතෘ නිවාසය, පූනකරි ... ... | 100... | 600 | | 450... | — ... | 450... | 2,100... | 375... | — ... | 375... | 1,850 |
| 7. ග්‍රාමීය රෝහල, පන්ඩතරිප්පු ... | 100... | 400 | | 275... | — ... | 275... | 1,350... | 250... | — ... | 250... | 1,350 |
| 8. ග්‍රාමීය රෝහල, වඩ්ඩුකොඩ්ඩෙයි ... | 100... | 400 | | 250... | — ... | 475... | 975... | 550... | — ... | 1,025... | 2,075 |
| 9. ග්‍රාමීය රෝහල, වෙම්පියන්පත්තු ... | 100... | 600 | | 725... | — ... | 725... | 1,100... | 1,200... | — ... | 1,225... | 1,800 |
| 10. ග්‍රාමීය රෝහල, අච්චුවේලි ... | 100... | 400 | | 450... | — ... | 925... | 1,850... | 1,200... | — ... | 2,225... | 4,600 |

7-125—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම මෙම කාර්යාලයේදී අවසානවූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘතකිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘතකරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන්කර ඇති මිළගණන් ද එසේ පෙනී සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට අවශ්‍යයයි සිතන්නෙහි නම් මා හෝ මගෙන් බලය ලත් නියෝජිතයකු සමඟ හෝ විධිවිධාන යොදාගෙන ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයෙහි දෙවන පිටපත පරීක්ෂාකළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරනලද මිළගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් ව ඇති කොන්ත්‍රාත්තුවේ කාලය තුල වලංගුවේ. මේ කොන්ත්‍රාත්තුව අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළගණන් කවර හේතුවක් නියාවත් වෙනස්කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **ඇපමුදල් තැන්පත් කිරීම.**—තෝරාගන්නාලද ටෙන්ඩර්කරු ඇප මුදල් තැන්පත්කිරීමෙන් පසුව පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන අය එහි අඩංගු කොන්දේසි හොඳින් කියවාබලා දැනගත යුතුවාන් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර මෙම කර්යාලයෙන් ඉල්ලුම්කොට ලබාගත හැක.

1964 ජුනි මස 27,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

පී. කේ. රත්නසිංහම්,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි.

## උපලේඛනය

| සේවය | ප්‍රදේශය | සැපයිය යුතු දළ ප්‍රමාණය — කිරිපිටි හො. | සැපයිය යුතු දළ ප්‍රමාණය — සීනි හො. | අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1. රත්නපුර දුම්රියපොලේ සිට කිරිපිටිත් නවදුන් කුකුළුදෙකෝරලේ සමුපකාර සංගමයේ සිට සීනිත් රත්නපුර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට සහ එම කාර්යාලයේ සිට එම සෞඛ්‍ය ප්‍රදේශය සහ ඇහැලියගොඩ සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ ප්‍රදේශයේ කිරි මධ්‍යස්ථානවලට ... | රත්නපුර ... | 24½ ... | 9½ ... | 64.7.28 පූ. භා. 10ට |
| 2. කහවත්ත දුම්රියපොලේ සිට කිරිපිටිත් කොලොන්න අටකලන් දෙකෝරළයේ සමුපකාර සංගමයේ සිට අටකලන් පන්නේ සෞඛ්‍ය කාර්යාලයටත් එම ස්ථානයේ සිට එම සෞඛ්‍ය ප්‍රදේශයේ කිරි මධ්‍යස්ථානවලට ... | අටකලන්පන්න | 24 ... | 9 ... | 64.7.28 පූ. භා. 10ට |

7-143—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

ඇමුනුම් අංක 1

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කුරුණෑගල කොට්ඨාශය

### කිලිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1964 ඔක්තෝම්බර් 1 වෙනි දින සිට 1965 සැප්තැම්බර් 30 වෙනිදායින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාර ගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරිගෙන් ද ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ටෙන්ඩර් පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකි වීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වෙනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා සෞඛ්‍ය සේවා අධිකාරි, කුරුණෑගල, කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු හෝ මා විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වෙනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවොත් ඊට යන වියදම් ආදිය පලාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටු රෙදි වල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යෑමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පලාත් පාලන මණ්ඩල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පලාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩල තුළ ඇති නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කුරුණෑගල,
1964 ජූනි 18 දින.

ඩබ්ලිව්. එස්. පෙරේරා,
සෞඛ්‍ය සේවා අධිකාරි.

උපලේඛනය

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. | 3<br>ඇප මුදල<br>රු. | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | 6<br>ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| කුරුණෑගල රජයේ මහ රෝහල : | | | | | |
| අංශය 1 ... ... | 50 ... | 100 ... | 4 ... | 3,998 | |
| අංශය 2 ... ... | 50 ... | 100 ... | 4 ... | 3,246 | |
| අංශය 3 ... ... | 50 ... | 200 ... | 30 ... | 14,461 | 64.7.30 පෙරවරු 10 ට |
| අංශය 4 ... ... | 50 ... | 100 ... | 4 ... | 1,204 | |
| අංශය 5 ... ... | 50 ... | 100 ... | 4 ... | 1,160 | |
| අංශය 6 ... ... | 50 ... | 100 ... | 30 ... | 749 | |

7-191—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කිස් පීප්ප මිලයට ගෙන අස් කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් (ලිපිනය : මහා ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, කොළඹ 1.) 1964 ජූලි මස 29 වෙනි බදාදා පෙ.ව. 11 වෙන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු අවශ්‍ය වුවහොත් ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ කාර්යා කාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට ඒ සම්බන්ධ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිතැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1964 ජූලි මස 28 වෙනි අඟහරුවාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

1964 ජූලි මස 30 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ප්‍රවාහණ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරිතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1964.6.19 වෙනි දින,
කොළඹ දීය.

7-36—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### අමතර කොටස් සහිත අන්වීක්ෂ සැපයීම සඳහා ටැන්ඩර්

අමතර කොටස් සහිත අන්වීක්ෂ (මයික්‍රස්කෝප්) සැපයීම සඳහා 1964 ඔක්තෝබර් මස 2 වන සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ සිරිමතිපායේ පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටි විට අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා වෙනුවෙන් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩු බාහිරු සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. කොළඹ ටැන්ඩර්කරු හවතුන් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, එච්. ඒ. ශාඛාවෙහි ද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියකද රුපියල් 100 ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964 ඔක්තෝබර් මස 1 වෙනි දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරණු ලැබේ.

අර්වින් ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙනුවට.

1964 ජූලි මස 3 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

7-117—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ධීවර කාර්මිකයින් සඳහා යාකර සාදන වැසිකිළි සහිතවූ ගෙවල් 10ක් ගාළු දිස්ත්‍රික්කයේ ද්‍රව මෝදර සෑදීම

ධීවර කාර්මිකයින් සඳහා යාකර සාදන වැසිකිළි සහිතවූ ගෙවල් 10ක් ගාළු දිස්ත්‍රික්කයේ ද්‍රව මෝදර සෑදීම සඳහා ටෙන්ඩර් 1964 ජූලි මස 24 වැනි සිකුරාදා දවල් 10 වනතුරු කොළඹ, ගාළුමුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් භාරගන්නවා ඇත.

2. කොළඹ ගාළු මුවදොර ධීවර අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් එවිය යුතුයි. රුපියල් 50,000 කට හෝ ඊට වඩා ගොඩනැගිලි ඉදි කිරීම සඳහා රජයේ ලියා පදිංචිවූ තැනැත්තන්ට පමණක් 1964 ජූලි මස 23 වැනිදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරණු ලැබේ.

3. ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ ගාළු මුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදී රුපියල් 100 ක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී එසේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. වැඩි තොරතුරු ධීවර අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකියි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

1964 ජූනි මස 22 වැනිදා,
කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

7-72—64.7.3 දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජූලි මස 24 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| | පාසැලේ නම | කලයුතු වැඩය |
|---|---|---|
| 1. | අ/අනුරාධපුර කාන්තා ගුරු විද්‍යාලය | භෝජනාගාරය සහ මුලුතැන්ගෙය වැඩිදියුණු කිරීම |
| 2. | අ/වල්පොල විද්‍යාලය ... | ගුරු නිවාසය හා වැසිකිළි 2 ක් තැනීම |
| 3. | අ/ගෝනුහද්දෙනාව විද්‍යාලය | එම |
| 4. | අ/බණ්ඩාරඋල්පොත විද්‍යාලය | ගුරු නිවාසයක් සහ වැසිකිළියක් තැනීම |
| 5. | අ/තිත්තගෝනෑව විද්‍යාලය ... | එම |
| 6. | අ/කැබිතිගොල්ලෑව මහා විද්‍යාලය | වතුර පොම්පයක් සපයා සවි කිරීම |

**සංලක්ෂ්‍යය—1.** අ = අනුරාධපුර දිස්ත්‍රික්කය

**සංලක්ෂ්‍යය—2.** අවශ්‍ය ලියා පදිංචි කිරීම :

| | | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුව සහ අනුමත සමිති |
|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් |
| අංක 1 | ... | 15,000 | ... | 15,000 |
| අංක 2–3 | ... | 14,000 | ... | 14,000 |
| අංක 4–5 | ... | 13,000 | ... | 13,000 |
| අංක 6 | ... | 2,500 | ... | 2,500 |

2. ඉහත දැක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නො අඩු ගණනකට ගොඩනැගිලි වැඩ කළ හැකි බවට සමූපකාර රෙජිස්ත්‍රාත් තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ සහතිකයක් අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාට ඉදිරිපත් කළ හැකි විවිධ සේවා සමූපකාර සමිතිවලට, ග්‍රාමසංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූලි මස 23 වැනි දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රුපියල් 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවෙනි ඡෙදයේ සඳහන් වන පරිදි අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යාක්ෂ තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලු විස්තර හා තොරතුරු අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගෙන් දැන ගත හැකිය. සැලැස්ම එහි දී බලා ගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති අධ්‍යාපන කාර්යාලය, අනුරාධපුරය" යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන්, එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කරණ ලද තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාර ගත් බවට එකෙනෙහි ම ලියවිල්ලක් ලබා ගත යුතුය.

එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නම ද, ලියා තිබිය යුතුයි.

5. 1964 ජූලි මස 24 වැනි දින පස්වරු 2.30 ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් විවෘත කරණ විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරණු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිළධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද, රේට් ගණන් ද ටෙන්ඩර් කරුවන්ගේ නම ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාළයක් තුල ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නොපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේම කම්කරුවන් ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරණු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතුව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසරදී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විට ම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළසේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උ. මැ. ප්‍ර. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂිකා.

1964 ජූනි 27 වැනි දින,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදිය.

7–142/1—1964. 7. 3. දින අංක 14,092 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජූලි මස 24 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| | පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|---|
| 1. | අ/ අනුරාධපුර කාන්තා ගුරු විද්‍යාලය | ප්‍රායෝගික විදුහල් ගොඩනැගිලි සහ ජල නල සේවය වැඩි දියුණුව |
| 2. | අ/ අනුරාධපුර කාන්තා ගුරු විද්‍යාලය | සයනාගාර 6ක් සහ රැස්වීම් ශාලාව වැඩිදියුණු කිරීම |
| 3. | අ/බුදුගෙහින්න මහා විද්‍යාලය | ගුරු නිවාසය, වැසිකිලි සහ කැසිකිලි තැනීම |

**සංලක්ෂ්‍යය.—1.** අ = අනුරාධපුර දිස්ත්‍රික්කය.

**සංලක්ෂ්‍යය.—2.** අවශ්‍ය ලියා පදිංචි කිරීම—

| | | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | ප්‍රසිද්ධ වැඩ දෙපාර්කමේන්තුව සහ අනුමක සමිති |
|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් |
| අංක 1 සහ 2 | ... | 25,000 | ... | 25,000 |
| අංක 3 | ... | 20,000 | ... | 20,000 |

2. ඉහත දක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නො අඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමූපකාර සමිතිවලට, කම්කරු සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූලි මස 21 වැනි දින දවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර, පොස්ටල් ඕඩර යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීම් පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවෙනි ඡෙදයේ සඳහන්වන පරිදි අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලු විස්තර හා තොරතුරු අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගෙන් දැන ගත හැකි ය. සැලැස්ම එහිදී බලා ගත හැකි ය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2." යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කරණ ලද තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ

ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාය්‍යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාර ගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතු ය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද, ලියා තිබිය යුතුයි.

5. 1964 ජූලි මස 24 වැනි දින පස්වරු 2.30 ට කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරණ විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද, රේට් ගණන් ද ටෙන්ඩර් කරුවන්ගේ නමද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්ෂාකර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නොපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන් ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතු ය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ ම කම්කරුවන් ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතුව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විට ම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළා සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම් ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උ. මැ. ප්‍ර. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂිකා.

1964 ජුනි 27 වැනි දින,
අනුරාධපුර අධ්‍යාපන කාය්‍යාලයේ දී ය.

7–142/2—64. 7. 3. දින අංක 14,092 දරන ගැසැට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 වූ ජූලි මස 24 වැනි සිකුරාද පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| | පාසැලේ නම | කළයුතු වැඩ |
|---|---|---|
| 1. | බ/පන්වැව සි. මි. පාසැල ... | පාසැල්ගොඩනැගිල්ල |
| 2. | බ/විහාරගොඩ සි.මි. පාසැල ... | එම |
| 3. | බ/ඇත්තලගෙදර තක්ෂිලා පාසැල | එම |
| 4. | බ/උඩුබාදන සි. මි. පාසැල ... | එම |
| 5. | බ/නමුණුකුල සි. මි. පාසැල ... | එම |
| 6. | බ/ගල්වෙලගම සි. මි. පාසැල ... | එම |
| 7. | බ/කරගහඋල්පොත සි.මි.පාසැල | එම |
| 8. | බ/බැද්දෙගම මහා විද්‍යාලය ... | විද්‍යා රසායනාගාරය |
| 9. | බ/රිල්පොල මැදගම සි.මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ල |
| 10. | බ/වංගියකුඹුර මහා විද්‍යාලය ... | ගුරු නිවාසයේ ඉතිරි වැඩ |
| 11. | බ/බෝගහකුඹුර සි. මි. පාසැල... | පාසැල් ගොඩනැගිල්ල |
| 12. | බ/ලුණුගල මහා විද්‍යාලය ... | විද්‍යා රසායනාගාරය |
| 13. | බ/සීවලී විද්‍යාලය (බණ්ඩාරවෙල) | පාසැල් ගොඩනැගිල්ල |
| 14. | බ/කඳුරුගමුව මහා විද්‍යාලය ... | එම |
| 15. | බ/කරගහවෙල සි. මි. පාසැල ... | එම |
| 16. | බ/ලියන්ගහවෙල මහා විද්‍යාලය | එම |

සංලක්ෂාය : අංක 1. බ=බදුල්ල

අංක 2. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම.

| | |
|---|---|
| අංක 1 ... | රු. 16,000 |
| අංක 2 ... | රු. 17,000 |
| අංක 3 සිට 6 ... | රු. 18,000 |
| අංක 7 ... | රු. 20,000 |
| අංක 9 සහ 10 ... | රු. 21,000 |
| අංක 8 සහ 11 ... | රු. 23,000 |
| අංක 12 ... | රු. 24,000 |
| අංක 13 සහ 14 ... | රු. 25,000 |
